# A/HRC/49/9

## සංස්කරණය නොකළ පූර්ව පිටපත

2022 පෙබරවාරි 25

මුල් පිටපත: ඉංග්‍රීසි

**මානව අයිතිවාසිකම් මණ්ඩලය**

**හතළිස්නම වැනි සැසිය**

**2022 පෙබරවාරි 29-2022 අප්‍රේල් 1**

න්‍යාය පත්‍ර අංක 2

එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් ගේ වාර්ෂික වාර්තාව සහ

මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලයේ සහ මහ ලේකම්ගේ වාර්තා

## ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය

**එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් ගේ වාර්තාව***


සාරාංශය

වත්මන් යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කරනුයේ මානව අයිතිවාසිකම් මණ්ඩලයේ යෝජනා අංක 46/1 අනුකූලවය. මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR ) ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය සහ සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රගමණය සඳහා දිගටම පවතින අභියෝග පිළිබඳ සිය නිරීක්ෂණ ඉදිරිපත් කරයි. එය 2021 පෙබරවාරි මස මහ කොමසාරිස් ගේ අවසාන වාර්තාව, ඒ දිනවල හඳුනාගත් පුළුල් ප්‍රවනතා ඇතුළත්ව, එතැන් සිට වූ වර්ධනයන් පිළිබඳව අවධානය යොමු කරයි. මෙම වාර්තාවට යෝජනා අංක 46/1 වගවීමට අදාල සමහර කරුනු ක්‍රියාත්මක කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳ යාවත්කාලීන කිරීම් ද ඇතුළත් ය.

ශ්‍රී ලංකාවේ අතීතයේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ විශේෂයෙන් 2009 දී අවසන් වූ ගැටුමෙන් පැන නගින ඒවා ඇතුළත්ව වින්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිගැනීමේ වගවීම දිගටම


---

*මෙම වාර්තාව ඉදිරිපත් කරනුයේ සාමාජික රාජ්‍යයට උපදේශන ලබා දීමට වූ අවසාන දිනයෙන් පසුවය.

නොමැතිවීම පිළිබඳව මහ කොමසාරිස් විමසිල්ලෙන් පසුවේ. ඇය හමුදාකරණයේ ප්‍රවනතාවය සහ වාර්ගික, ආගමික ජාතිවාදය කෙරේ යොමුවීමේ සහ ප්‍රජාතන්ත්‍රීය ආයතන දුර්වල කරන, සුළුතරයේ සැක සංකා වැඩි කරන, සහ සංහිඳියාවට බාධා කෙරෙන දිගටම පවතින ප්‍රවනතා ඉස්මතු කර දක්වයි. ඒ සමගම ආණ්ඩුව මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමග සම්බන්ධවීමට අලුතින් ඇති වූ විවෘතභාවයේ මෑතක දක්නා ලැබෙන සංඥා සහ සමහර ප්‍රතිසංස්කරණවලට මුළ පිරීමට ගෙන ඇති මූලික පියවර ද මහ කොමසාරිස්වරිය පිළිගනී. කෙසේ වුවත් අව්‍යාජ සංහිඳියාව සහ වගවීමේ ක්‍රියාවලියක් සඳහා විස්තීර්ණ වූ දැක්මක් සහ මුක්තිය අවසන් කරන සහ අතීතයේ සිදු වූ උල්ලංඝනය කිරීම් නැවත ඇතිවීම වළක්වන ආයතනික සහ ආරක්ෂක අංශයේ ගැඹුරු සංශෝධන කඩිනමින් අවශ්‍යයැයි මහ කොමසාරිස්වරිය විශ්වාස කරන්නීය.

1. හැඳින්වීම

1. එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය මෙම යාවත්කාලින කිරීම් ඉදිරිපත් කරනුයේ සංහිඳියාව සහ වගවීමේ ප්‍රගතිය ඇතුළත්ව ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය අධීක්ෂණය සහ වාර්තා කිරීම වඩාත් ශක්තිමත් කිරීමට මානව අයිතිවාසිකම් මණ්ඩල යෝජනා අංක 46/1 ඉල්ලා ඇති ආකාරයට සහ හතළිස් නම වැනි සැසියට ලිඛිත යාවත්කාලීන කිරීම් ඉදිරිපත් කිරීම සඳහා ය. [1] එය මහ කොමසාරිස් ගේ ශ්‍රී ලංකාව පිළිබඳ 2021 පෙබරවාරි මස නිකුත් කළ අවසාන වාර්තාවෙන් පසුව, ඒ දිනවල හඳුනා ගත් පුළුල් ප්‍රවනතා ඇතුළත්ව, එතැන් සිට වූ වර්ධනයන් ගැන අවධානය යොමු කරයි. මෙම වාර්තාවට තොරතුරු සහ සාක්ෂි රැස් කිරීමට, ඒකාබද්ධ කිරීමට විශ්ලේෂණයට සහ සංරක්ෂණයට සහ අනාගත වගවීමේ ක්‍රියාවලීන් සඳහා යොදා ගත හැකි උපාය මාර්ග වර්ධනය කිරීමට සහ වින්දිතයන් සහ ජීවත්වන අය වෙනුවෙන් පෙනී සිටීමටත් නිසි අධිකරණ ක්‍රියා මාර්ග ඇති සාමාජික රටවල් ඇතුළත්ව අදාල අධිකරණ සහ වෙනත් ක්‍රියා පටිපාටි ගැනීමට එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ ධාරිතාව ශක්තිමත් කිරීමට ගත් පියවර පිළිබඳ යාවත්කාලීන කිරීම් ද ඇතුළත් ය.[2]

2. මෙම යාවත්කාලීන සකස් කිරීම මුළුල්ලේම ආණ්ඩුව දැක් වූ නිර්මාණශීලී සම්බන්ධතාවය එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය අගයයි. මෙම කාර්යාලය ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට 2021 ඔක්තෝබර් 25 ප්‍රශ්න මාලාවක් යැවූ අතර 2021 දෙසැම්බර් 8 දින, පසුව එකතු කළ යාවත්කාලීන කිරීම් කීපයක් සමග සවිස්තරාත්මක ලිඛිත නිමැවුම් එවන ලදී.[3] වැඩි දුරටත් ආණ්ඩුව 2022 ජනවාරි මස වැඩි දුර උපදේශනය සඳහා මෙම කාර්යාලයේ නියෝජිත පිරිසක ශ්‍රී ලංකා සංචාරයකට එකඟ වුවත් යුරෝපයේ පැවති කොවිඩ් 19 තත්වය නිසා එය කිරීමට අපහසු විය. ඒ වෙනුවට ජනවාරි 24 දින මෙම කාර්යාලය ආණ්ඩුවේ පාර්ශ්වයන්

[1] A/HRC/RES/46/1, para 16.

[2] Ibid, para 6.

[3] Note Verbale (NV) 457/2021, 8 December 2021 (thereafter NV 457/2021) and Note Verbale 16/2022 (information from Office for Reparations) from the Permanent Mission of Sri Lanka in Geneva.

සමග දුරස්ථ ( Virtual ) උපදේශනයක් පැවැත් වූ අතර මෙම කාර්යාලය වෙනත් පාර්ශ්වයන් ගණනාවක් හමු වූයේය. මෙම අදහස් හුවමාරු කර ගැනීම්වල විවෘත භාවය සහ ප්‍රාමාණික ස්වභාවය මෙම කාර්යාලය අගය කරයි. අදහස් ලබා දීමේ අවස්ථාවක් සඳහා මෙම වාර්තාව ආණ්ඩුවට ලබා දෙන ලදී.

3. හේතු සහ ආනිශංස ඇතුළත් සමකාලීන වහල් භාවයේ ආකාරයන් පිළිබඳ විශේෂ වාර්තාකරු 2021 නොවැම්බර් 26 සහ දෙසැම්බර් 3 අතර කාලයේ ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුණේය. [4] ආණ්ඩුව අධ්‍යාපන අයිතිවාසිකම් පිළිබඳ විශේෂ වාර්තාකරුගේ සංචාරයකට ද එකඟ වූ නමුත් ඊට තවම දින නියම කර ගෙන නැත. 2021 පෙබරවාරි 5 දින විශේෂ ක්‍රියා පටිපාටි 10, 2015 සහ 2019 [5] අතර කාලයේ දී ඔවුන් සිදු කළ නිල සංචාරවලින් අනතුරුව කරන ලද මූලික නිර්දේශ සිහි ගන්වමින් ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කෙළේය. 2021 වසර තුළ විශේෂ ක්‍රියා පටිපාටි ශ්‍රී ලංකාව පිළිබඳව නිර්දේශ නමයක් නිකුත් කරන ලද අතර 2022 පෙබරවාරි 14 වන විට ආණ්ඩුව ඉන් පහකට ප්‍රතිචාර දක්වා ඇත.[6]

## II සන්දර්භය

4. 2020 සිට ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතයේ රැලි ගණනාවකට මුහුණ දුන් අතර එය මහජන සෞඛ්‍යය සහ ආර්ථික සහ සමාජ අයිතිවාසිකම් පිළිබඳ විවිධ පැතිමානයන්ගේ බලපෑම්වලට මුහුණ දුන්නේය. ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම නිදහස් සෞඛ්‍ය රැකවරණයක් පවත්වා ගන්නා අතර ආණ්ඩුව එන්නත් කිරීමේ ඉහළ අනුපාතයක් අත්කර ගත්තේය. එමෙන්ම නොයෙකුත් දිරි ගැන්වීම් සහ ආර්ථික ආධාර පියවර ක්‍රියාත්මක කෙළේය. කෙසේ වුවත් දිගු ගැසුණ වසා තැබීම් සහ සංචරණ බිඳ වැටීම් සංචාරක කර්මාන්තය, ඇඟලුම්, සේවා සහ ප්‍රවාහනය වැනි වැදගත් අංශවලට බලපෑමක් වූ අතර අපනයන ආදායම සහ සම්ප්‍රේෂණ පහත වැටීමට හේතු විය. කෙසේ වුවත් මතු වෙමින් පැවති මූල්‍ය ණය අර්බුදය විසඳීමට ගත් ප්‍රතිපත්ති, ආනයන සීමා, මුදල් ඒකකය අවප්‍රමාණයවීම සහ ආහාර සහ ඉන්ධන මිල උද්ධමනය වැනි නොයෙකුත් ආර්ථික සහ සමාජ ප්‍රතිඵල ඇති කරවීය. [7]

5. ලෝක බැංකුවට අනුව, ප්‍රධාන වශයෙන් නොවිධිමත් අංශයේ සේවකයන් සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන්ට බලපෑ රැකියා සහ වැඩ කිරීමේ පැය ගණන අහිමිවීම් නිසා වසංගතය ආරම්භයේ සිට 500,000කට අධික පිරිසක් දරිද්‍රතා මට්ටමෙන් පහත වැටිණ. [8]

[4] සමකාලීන වහල් භාවය පිළිබඳ විශේෂ වාර්තාකරුගේ දූත මෙහෙය අවසානයේ නිකුත් කළ ප්‍රකාශය 2021 දෙසැම්බර් 3 https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=27895&LangID=E

[5] https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=26725&LangID=E.

[6] ලබා ගත හැකි තැන්:
https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadFile?gId=36694; and
https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadFile?gId=36775;
https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadFile?gId=36580;
https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadFile?gId=36496;
https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadFile?gId=36539).

[7] Sri Lanka Overview: Development news, research, data | World Bank

[8] SriLanka-DevUpd-Apr9.pdf (worldbank.org), page 27.

නොවිධිමත්, ඇඟලුම් සහ රෙදි පිළි අංශවල සේවා බලකායෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කාන්තාවන් වන නිසා රැකියා හෝ ආදායම් නැතිවීමෙන් අප්‍රමාණ වූ කොටසක් වූයේ ඔවුන් ය.[9] සත්කාරක රටවල බොහෝ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් ගේ රැකියා අහිමිවීමෙන් සම්ප්‍රේෂණ ආධායම්වලට බලපෑමක් විය.[10]

6. ආර්ථික තත්වය ආහාර සුරක්ෂිත භාවය කෙරේ ද බලපෑමක් විය. පවුල්වලින් සියයට 44ක් ආහාර ගැන විමසිලිමත් වූ බව ලෝක බැංකු සමීක්ෂණය පෙන්වයි. [11] කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා, විරෝධතා නිසා පසුව ඉවත් කර ගත් පොහොර තහනම හඳුන්වා දීම ආහාර නිෂ්පාදනය කෙරේ බලපෑමක් විය. අගොස්තු මාසයේ දී ආණ්ඩුව ඉහළ යන ආහාර මිල හමුවේ සහ සමහර අත්‍යාවශ්‍ය භාණ්ඩවල හිඟතාවය නිසා වාර්තා වූ ආකාරයට වෙළඳුන්ගේ සමපේක්ෂණ පුරුදු සීමා කිරීමට හදිසි නීති රෙගුලාසි හඳුන්වා දුන්නේය. ඒවා දැන් අවසන්ව ඇත.[12]

7. ආර්ථික තත්වය සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳ අසහනය විරෝධතාවලට හේතු විය. ඊට ප්‍රතිචාර වශයෙන් ආණ්ඩුව විවිධ ආර්ථික සහ සමාජ ගැටලු පිළිබඳව පැවති පෙළපාලි සීමා කිරීමට නිවාරණ රෙගුලාසි සහ වෙනත් නීති ඇතුළත් කොවිඩ් 19 පිළිබඳ පියවර ක්‍රියාත්මක කරන ලදී. සමහර අවස්ථාවල විරෝධතා සාමකාමී වුවද විරෝධතාකරුවන් අත් අඩංගුවට ගෙන චෝදනා ඉදිරිපත් කරන ලදී. [13] මෙය මහජන සෞඛ්‍ය හේතු මත අවශ්‍යයැයි ආණ්ඩුව කියා සිටියේය. කෙසේ වුවද අවස්ථා කීපයක දී විරෝධතා නතර කිරීමට පොලීසියෙන් කළ ඉල්ලීම් උසාවියෙන් ප්‍රකාශනයේ සහ සාමකාමී රැස්වීමේ නිදහසට ඇති අයිතිය පෙන්වා දෙමින් ප්‍රතික්ෂේප කෙරිණ.

8. 2021 ජුනි මස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සයිබර් අවකාශයේ මුර සංචාරයේ යෙදීමට සහ සමාජ මාධ්‍යයේ කොවිඩ් 19 සහ වෙනත් සංවේදී කරුණු පිළිබඳව ''බොරු ආරංචි'' පතුරුවන අය අත් අඩංගුවට ගැනීමට විශේෂ කණ්ඩායමක් පිහිටු වූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකයා පැවසුවේය.[14]

9. ''මාර්ගතව බොරු පැතිරවීම සහ තමන්ට අවශ්‍ය පරිදි යොදා ගැනීමෙන් ආරක්ෂා වීමට'' නව නීතියක් කෙටුම්පත් කරන බව ආණ්ඩුව මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට දැනුම් දුන්නේය. [15] ප්‍රකාශනය, මතයක් දැරීම සහ තොරතුරු නිදහසට ඇති අයිතිය භුක්ති විඳීමේ දී බරපතළ බලපෑම් ඇතිවිය හැකි මෙවැනි නීති පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ කරන ලද නිරීක්ෂණ ගැනත්, මෙම නීතිය සකස් කිරීමේ දී සිවිල් සමාජයේ සහ ස්වාධීන

---

[9] එම බලන්න Research Brief: සැපයුම් දාමයේ රැලි බලපෑම: කොවිඩ් 19 ආසියාව සහ පැසිපික් කලාපයේ ඇඟලුම් සේවකයන්ට සහ කම්හල්වලට බලපාන්නේ කෙසේද? බලන්න ( ilo.org)

[10] talking economics - විදේශ රැකියාවලින් ආපසු පැමිණීම සහ වෙනත් රැකියා: කොවිඩ් 19 සමයේ ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය ගැන කටයුතු කිරීම (ips.lk).

[11] Sri Lanka Overview: Development news, research, data | World Bank.

[12] Extraordinary Gazette 2243/1 of 30 August 2021 and Extraordinary Gazette 2243/3 Emergency (Provision of Essential Food) Regulation No. 1 of 2021.

[13] එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන්ගේ ඒකාබද්ධ සන්නිවේදන බලන්න. AL LKA (4.2021), 17 August 2021

[14] https://www.themorning.lk/no-warrant-needed-for-fake-news-arrests/.

[15] NV 457/2021 පිටුව 11

මාධ්‍යයේ නියෝජිතයන් සමග පූර්ණ උපදේශනයක් තහවුරු කිරීමටත් සැලකිලිමත් වන ලෙස මහ කොමසාරිස්වරිය ආණ්ඩුව දිරිමත් කළාය.

## අ. මානව අයිතිවාසිකම්වලට බලපාන නීතිමය සහ ආයතනික වර්ධනයන්

10. මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය ඇගේ කලින් වාර්තාවෙන් විශේෂයෙන් අධිකරණයට සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම ඇතුළත් ස්වාධීන ආයතනවලට පත්කිරීමේ ක්‍රියාවලිය වෙනස් කළ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව ශ්‍රී ලංකාවේ මූලික ආයතනවල ස්වාධීනත්වය බාදනයට ලක්වීම ගැන අනතුරු හැඟවූවාය. [16]

11. 2021 නොවැම්බර් මස ජාතික මානව අයිතිවාසිකම් ආයතන පිළිබඳ ගෝලීය සන්ධානය ( GANHRI ) විශේෂ පුනරීක්ෂණයකින් පසුව හේතු තුනක් මත ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම ඒ සිට බී දක්වා පහත හෙළීමට නිර්දේශ කෙළේය. එනම් පත්වීම් සිදු කිරීමේ ක්‍රියාවලියේ පාරදෘශ්‍ය භාවයක් සහ ස්වාධීනත්වයක් නොමැතිවීම, බහුවිධ භාවයක් සහ විවිධත්වයක් නොමැතිවීම සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට සිය මැන්ඩේට් අධිකාරිය ස්වාධීනව සහ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම [17] 2021 දෙසැම්බර් මස මානව හිමිකම් කොමිසමේ සභාපති තනතුරට ශ්‍රේෂ්ඨාධිනරණයේ විශ්‍රාමික විනිසුරු රෝහිණී මාරසිංහ පත් කර ඇත.

12. වැදගත් නියමයන් ලබා දුන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් කොමිසමේ සභාපති තනතුරට විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න පත් කිරීමෙන් එහි ස්වාධීනත්වයට බලපෑම් විය හැකි නිසා ඒ ගැන මහ කොමසාරිස්වරිය සැලකිලිමත් වන්නීය. කලින් වාර්තාවල ඉස් මතු කර දැක්වූ ආකාරයට විනිසුරු උපාලි අබේරත්න සිදු වූයේයැයි කියන දේශපාලන පලි ගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසමේ සභාපති වශයෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ 'සංකේතාත්මක'' නඩු කීපයක විභාග පරිපාටියට බාධා කිරීම සහ මැදිහත්විම සිදු කෙළේය.[18]

13. දැනට සිදු වෙමින් පවතින නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම් පත සකස් කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා, මූලික ආයතනවල ස්වාධීනත්වය, සංහිඳියාව සහ ' තම ජනතාවගේ සියලු සාමාජිකයන් විසින් පූර්ණව භුක්ති විඳීමට අනුකලනීය වන බවට' මානව අයිතිවාසිකම් මණ්ඩලය සටහන් කළ දේශපාලන අධිකාරිය විමධ්‍යගත කිරීම මූලික වශයෙන්ම වැදගත් බව මහ කොමසාරිස්වරිය අවධාරණය කරන්නීය.[19] ආණ්ඩුව විසින් පත් කරන ලද විශේෂඥ කමිටුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම් පත් කරන අතර අදහස් ලබා දෙන ලෙස ජනතාවට ආරාධනය කර ඇත.[20] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් එක්සත් ජාතින්ගේ නොයෙකුත් මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ වසර කිපයක් තිස්සේ ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ නිර්දේශ සැලකිල්ලට ගන්නා ලෙස මහ කොමසාරිස්වරිය ආණ්ඩුවෙන්

---

[16]. A/HRC/46/20, para. 24.

[17] GANHRI ප්‍රතීතන වාර්තාව පිළිබඳ අනු කොමිටිය– 20221 ඔක්තෝබර්, 2021 දෙසැම්බර් පිටුව 31 https://www.ohchr.org/Documents/Countries/NHRI/GANHRI/SCA-Report-October-2021_E.pdf

[18] HRC/46/20, paras. 26 and 27.

[19] A/HRC/RES/25/1, 9 April 2014

[20] Note Verbale 64/22, 22 February 2022 (NV 64/22), para 24.

ඉල්ලා සිටින්නීය. කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර උපදේශන සහ විවාදය සඳහා මහජනතාවට ලබා දෙන ලෙස ද ඇය ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නීය.

## ආ. හමුදාකරණය සහ ඉඩම් ගැටලුව

14. කලින් වාර්තාවලින් නිරීක්ෂණය කළ ආකාරයට පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සිවිල් කටයුතුවල හමුදාකරණයේ වැඩිවීමක් දක්නට ලැබිණ. [21] මෙම පත්වීම් කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා සහ නීතියට අනුකූලව සිදු කරන්නේයැයි ආණ්ඩුව හේතු යුක්ති කරයි. කෙසේ වුවත් හමුදා නිලධාරීන් වෙත සිවිල් තනතුරු ඒකරාශිවීම ප්‍රජාතන්ත්‍රීය පාලනයටත් රාජ්‍යයේ ස්වභාවයටත් දීර්ඝ කාලීනවත් බලපාන්නේයැයි මහ කොමසාරිස්වරිය කණස්සල්ල පළ කරන්නීය.

15. ආරක්ෂක අමාත්‍යාංශයට අමතරව - බරපතළ මානව අයිතිවාසිකම් උල්ලඝනය කෙළේයැයි සම්බන්ධතා ඇති සමහරුන් ඇතුළත් සේවයේ යෙදී සිටි සහ දැනට සේවයේ යෙදී සිටින හමුදා නිලධාරීන් විදේශ කටයුතු, මහජන ආරක්ෂාව, මුදල්, සෞඛ්‍යය, වනජීවී, සහ වන සංරක්ෂණය ඇතුළත් අමාත්‍යාංශ කිපයක අධිකාරියක් ඇති තනතුරු දැන් උසුලයි. රාජ්‍ය නොවන සංවිධාන නියාමන ලේකම් කාර්යංශය විදේශ අමාත්‍යාංශයට පවරා ඇති නමුත් මාධ්‍යයේ සිට ආගමනය දක්වා වෙනත් ආයතන අඩුම වශයෙන් 31ක් ආරක්ෂක අමාත්‍යාංශය පාලනය කරයි. නිදසුනක් වශයෙන් 2021 අගෝස්තු 21 ආහාර සුරක්ෂිත භාවය සහ මිල පාලනය සහතික කරනු සඳහා වූ හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා මේජර් ජනරාල්වරයෙකු පත් කර ඇත.[22] 2021 දෙසැම්බර් මස ජනාධිපතිගේ 'හරිත කෘෂිකර්ම මෙහෙයුම් කේන්ද්‍රය' ප්‍රවර්ධනය කිරීමට සහ කාබනික පොහොර බෙදා හැරීම ක්‍රියාත්මක කිරීමට හමුදාපති ජනරාල් ෂවේන්ද්‍ර සිල්වා පත් කෙළේය.[23]

16. 'පොලිස් කාර්යන් ඉටු කිරීම ශක්තිමත් කිරීමට අවශ්‍ය විට සන්නද්ධ සේවා යොදා ගැනීමට බලය පැවරෙන' මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙන් කෙරෙන දැනුම් දීම නැවත අලුත් කිරීම් ජනාධිපති දිගටම සිදු කරයි.[24] මෙවැනි නියෝග මගින් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා හමුදාකරණ පිවිසුමක් දිගටම පවත්වා ගෙන යන අතර පොලිස් කාර්යවල හමුදාමය භූමිකාව පුළුල් කරයි. උතුරු පළාතේ හමුදා මුරපොළවල් සංඛ්‍යාවේ අසාමාන්‍ය වැඩි බවක් පෙන්නුම් කරන බව වාර්තා වන අතර ආරක්ෂක පරීක්ෂා කිරීම්වලදී විශේෂයෙන්ම කාන්තාවන්ට වෙනස් කොට සැලකීම සහ හිරිහැර කිරීම් පිළිබඳ පැමිණිලි ද ඇත.

17. හමුදාව විසින් අත්පත් කර ගෙන ඇති ඉඩම්, විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වල, නිදහස් කිරීම සාමය ගොඩනැගීම සහ සංහිඳියාවේ වැදගත් ලක්ෂණයන්ව පවතී. 2009 සිට 2021 ඔක්තෝබර් 31 දක්වා සන්නද්ධ හමුදා විසින් නිදහස් කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 2,601,796ක් හෝ සියයට 92.42ක් බව ආණ්ඩුව වාර්තා කරයි. තවත් අක්කර 53ක් (සියයට 0.19ක්) නිදහස් කිරීමට යෝජනා කර ඇත.[25] කෙසේ වුවත් බෞද්ධ උරුමය සංරක්ෂණය සහ වනාන්තර

---

[21] A/HRC/43/19, para 33; HRC/46/20, paras 20-23.

[22] G 34894 (E) (I-I) Appointment by Presi.pmd (documents.gov.lk).

[23] හරිත කෘෂිකාර්මික මෙහෙයුම් කේන්ද්‍රයක් පිහිටුවීමට ජනාධිපති නියෝග කරයි.Daily News

[24] NV 64/2022, para 27; නිදසුනක් වශයෙන් 2021 දෙසැම්බර් 20 2259/2 අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න. E.pdf, (presidentsoffice.gov.lk)
[25] NV 457/2021, page 24.

ආරක්ෂාවට අදාලව අලුතින් ඉඩම් ආරවුල් ඇතිවීමේ ප්‍රවනතාවය සුළුතර ප්‍රජාවන් සමග, විශේෂයෙන්ම පළාතේ පවතින විවිධ වූ ජන සංඛ්‍යාව සහ උරුමයන් නිසා නැගෙනහිර පළාතේ නව උණුසුම්කාරී තත්වයක් නිර්මාණය කර ඇත.

18. 2020 ජුනි මස සිට ආරක්ෂක ලේකම් ගේ ප්‍රධානත්වයෙන් යුත් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීමේ කාර්ය සාධක බලකායක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පොලිසිය, හමුදාව සහ බෞද්ධ භික්ෂූන් සමග පුරාවිද්‍ය නටඹුන් ස්ථාන, හඳුනා ගැනීමට සහ බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය හෝ ඉදි කිරීමට ක්‍රියා කරති. ආණ්ඩුව ද පරිසර සහ වන සංරක්ෂණය පදනමින් ප්‍රදේශයේ ඉඩම් භාවිතයට සීමා පනවා ඇත. මෙම වැඩ සටහන ප්‍රදේශයේ ජනවිද්‍යා සහ භූදර්ශනය වෙනස් කිරීමට යොදා ගන්නා බවට සුළුතර ප්‍රජාව තුළ බියක් පවතී. මෙය ජීවන වෘත්තීන්ට බලපෑමක් විය හැකි අතර අලුතින් ගැටුම් ඇති කිරීමේ හැකියාවද පවතී.

19. 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා රාජ්‍ය අංශය සහ සුළුතර ප්‍රජාව අතර ඉඩම් මුල් කර ගත් මෙවැනි ආරවුල් 45ක් පිළිබඳ වාර්තා මහ කොමසාරිස් කාර්යාලය සටහන් කර ඇත. නිදසුනක් වශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ස්ථාන 11ක ඉඩම් අක්කර 340.33කට ආසන්න ප්‍රමාණයක් බෞද්ධ භාරකාර/ පන්සල් 30කට වසර 30ක කාලයකට කල්බදු ක්‍රමයට ලබා දී ඇත.[26] 2020 සැප්තැම්බර් මස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තෙන්නමරවාඩි හි පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනා ගැනීමෙන් පසුව දෙමළ ජාතික ගොවීන් ද උරුමකම් කියන ඉඩම් අක්කර 358ක් පවරා ගෙන ඇත.

## ඇ. වැඩිවන බහුතරවාදය සහ සංහිඳියාව සහ සාමය ගොඩනැගීම කෙරේ එහි බලපෑම

20. සැප්තැම්බර් මස මහා සභාවේ 76 වැනි සැසිය අමතමින් ජනාධිපති ''වර්ගය, ආගම හෝ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය නොසලකා සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞභාග්‍යමත්, ස්ථාවර සහ සුරක්ෂිත අනාගතයක් ගොඩනැගීමට '' ආණ්ඩුව සහතික වන බව පැවසුවේය.[27] කෙසේ වුවත් පසුගිය වසරේ ආණ්ඩුවේ වැඩ කටයුතුවලින් සිංහල ජාතිවාදය, බුද්ධාගම සහ රාජ්‍යය අතර සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් වූ අතර දෙමළ, මුස්ලිම් සහ කතෝලික සුළුතර ප්‍රජාවන් අතර කොන් කිරීම සහ සැක සංකා භාවය වැඩි කොට සංහිඳියාව සඳහා බලාපොරොත්තු යටපත් කෙරිණ.

21. 2021 ඔක්තෝබර් මස ජනාධිපති තම මැතිවරණ ප්‍රකාශයෙන් පොරොන්දු වූ ආකාරයට ''එක රටක් එක නීතියක්'' සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ආකෘති රාමුවක් සකස් කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කෙළේය. එහි අවසාන වාර්තාව 2022 පෙබරවාරි 28 වන විට භාර දිය යුතුය. විවාදයට තුඩු දෙන ආකාරයට එහි සභාපති ලෙස පත් කරනු ලැබුවේ මුස්ලිම් විරෝධී ප්‍රකාශ සහ වෛරී කතා ගැන ප්‍රකට අන්තවාදී බෞද්ධ සංවිධානයක් වන බොදු බල සේනා හි සභාපති බෞද්ධ භික්ෂුවක් වන ඥානසාර හිමි ය. ඥානසාර හිමි පසුගිය කාලයේ දී මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීම පිළිබඳව චෝදනාවන්ට ලක්ව

---

[26] රාජ්‍ය ඉඩම් රෙගුලාසි අංක 21(2) යටතේ දැනුම්දීම,http://documents.gov.lk/en/gazette.php

[27] https://www.un.int/srilanka/news/president-addresses-general-debate-76th-session-general-assembly-un-new-york-21-27-september.

සිටියේය. නිදසුනක් වශයෙන් 2014 අලුත්ගම සහ 2018 දිගන කල කෝලාහල දැක්විය හැකිය.[28] වෙනත් සිද්ධියක් දී 2018 අගෝස්තු ඔහු උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් වසර හයක සිර දඬුවමක් නියම වූ අතර 2019 මැයි මස ජනාධිපති සමාව ලැබිණ.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැනටමත් රට ඒකීය රාජ්‍යයක් ලෙසත් ( 2 ව්‍යවස්ථාව) පුරවැසියන් නීතිය ඉදිරියේ සමාන බවත් ( 12 ව්‍යවස්ථාව) පිළිගනී. නමුත් ''එක නීතියක් එක රටක්'' සංකල්පය දේශපාලන අධිකාරිය විමධ්‍යගත කිරීම සහ පළාත් මට්ටමේ නීති සම්පාදන බලතල කෙරේ බලපෑම් ඇති කළ හැකිය. විවිධ ප්‍රජාවන්ට විශේෂිත වූ පුරුදු පවත්වා ගැනීමටත් ශ්‍රී ලාංකීය සමාජයේ බහුවිධ අනන්‍යතාවන්හි විවිධත්වයත් පවත්වා ගැනීමට ඉඩ සැලසෙන සම්ප්‍රදායික පුද්ගල නීති මාලාවට ද අදාල විය හැකිය. අද ඒවා නිර්වචනය කෙරෙන්නේ උතුරු පළාතේ දෙමළ ජනතාවට අදාල වන තේසවලාමෙයි නීතිය, උඩරට සිංහලයින් සඳහා වරණාත්මක විවාහ සහ උරුමය පිළිබඳ රාමුවක් වන උඩරට නිතිය සහ මුස්ලිම් පුද්ගල නීතිය වශයෙනි. මෙම නීති පද්ධති තුනම මූලික වශයෙන් යොමු වන්නේ ඉඩම් ඇතුළක් දේපොළ, අන්තිම කැමැත්තක් නැති අනුප්‍රාප්තිය ඇතුළත් උරුමය සහ විවාහය සහ දික්කසාදය සඳහාය. එහෙත් එහි වැදගත් අනන්‍යතාවය පදනම් සංකේතාත්මක වටිනාකමක් ද පවතී.

23. 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත, සාමාන්‍ය විවාහ ආඥාපනත සහ සිවිල් පටිපාටි සංග්‍රහය පවතින අන්තර්ජාතික ප්‍රමිතින්ට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම සඳහා අධිකරණ ඇමති පත් කරන ලද මුස්ලිම් නීති සංශෝධන උපදේශක කොමිටියෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇති බව ආණ්ඩුව වෙන වාර්තාවකින් මහ කොමසාරිස් කාර්යාලයට දන්වා ඇත. නීති කෙටුම්පත් නිලධාරි දැන් සංශෝධන සූදානම් කරමින් සිටී.[29] වාර්තාවන ආකාරයට එම සංශෝධනවලට වෙනත් කරුණු අතර මුස්ලිම් අය සඳහා විවාහවීමේ අවම වයස අවුරුදු 18 ලෙස හඳුන්වාදීම, ක්වාසි උසාවිවල සාමාජිකයන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් හඳුන්වා දීම සහ කාන්තා සාමාජිකාවන් ඇතුළත් කිරීමේ හැකියාව සහ මුස්ලිම් අයට විවාහය පොදු නීතිය යටතේ ලියාපදිංචි කිරීම තෝරා ගැනීම ඉඩ සැලසීම ඇතුළත් වනු ඇත.[30] මහ කොමසාරිස්වරිය අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයට කාන්තාවන්ගේ සහ ගැහැනු ළමයින්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කෙරෙන කිසියම් ප්‍රගතිශීලී සංශෝධන සතුටින් පිළිගන්නා අතර මුස්ලිම් ප්‍රජාව සමග විශේෂයෙන්ම කාන්තාවන් සමග උපරිම උපදේශනයක් පවත්වා ගැනීම දිරිමත් කරන්නිය.

24. 2021 දී හමුදාව සහ ආණ්ඩුවේ නිලධාරීන්ගේ අනුග්‍රහය ඇතිව සංකේතාත්මක ස්ථානවල බෞද්ධ පන්සල්, පිළිම සහ විහාර ඉදි කරන ලදී. 2021 ජනවාරි 18 ජාතික උරුමයන් පිළිබඳ රාජ්‍ය ඇමති සහ හමුදා නිලධාරීහු උසාවි නියෝගයක් ද නොසලකා මුලතිවු දිස්ත්‍රික්කයේ පැරණි හින්දු පන්සලක් තිබුණේයැයි පැවසෙන ස්ථානයක ඉදි කරන ලද බුදු පිළිමයක් විවෘත කළහ.[31] 2021 නොවැම්බර් මස වාර්ගික ආගමික පදනමකින් ගැටුම පෙන්නුම් කරන වෘත්තාන්තය තහවුරු කරමින් 'යුද විරුවන්ට' උපහාර පිණිස හමුදාව විසින් අනුරාධපුර ඉදි කරන ලද නව මහා ස්ථූපයක්

[28] OHCHR, "ශ්‍රී ලංකාවඃ අන්තර්වාර්ගික ප්‍රචණ්ඩත්වයෙන් භීතියට පත් පිල්ලේ වෛරී කතා නවත්වන මෙන් ඉල්ලා සිටී.16 June 2014.

[29] NV 457/2021, page 13.

[30] ibid

[31] ජාතික උරුමයන් පිළිබඳ රාජ්‍ය ඇමති විමියෝ හි බුදු පිළිමයක් පිහිටුවයි.; උතුර නැගෙනහිර පුරා විද්‍යාත්මක කැනීම්, ස්ථාන 10ක වැඩ ඇරඹේ. - The Morning - Sri Lanka News.

පූජා කරන ලදී.[32] 2021 නොවැම්බර් රටේ ප්‍රමුඛ අධ්‍යාපන ආයතනයක් වන කොළඹ විශ්ව විද්‍යාලයේ කුලපති වශයෙන් බෞද්ධ භික්ෂුවක් පත් කිරීම ආගමික නොවන ස්වභාවය සහ අධ්‍යාපනික ස්වාධීනත්වය යටපත් කරවීමක්යැයි ගුරුවරු සහ ශිෂ්‍යයෝ විරෝධය දැක් වූහ.

25. ආණ්ඩුවට සම්බන්ධ පුද්ගලයන් කීප දෙනකුම මුස්ලිම් ප්‍රජාවට වැඩියෙන් බලපෑමක් වන ප්‍රතිපත්ති යෝජනා ඉදිරිපත් කළහ. 2021 පෙබරවාරි මස ආණ්ඩුව කොවිඩ්-19න් මියගිය පුද්ගලයන්ගේ සිරුරු ආදාහනය කිරීමේ ප්‍රතිපත්තිය ඉවත් කෙළේය. කෙසේ වුවත් භූමදාන කරන ස්ථානය වඩාත් ඉතා ඈතක වීම නිසා එය බැලීමට යෑම හෝ චාරිත්‍ර ඉටු කිරීම දුකට පත් පවුල්වලට ප්‍රයෝගික අභියෝගයක් විය. 2021 මාර්තු මස මහජන ආරක්ෂාව පිළිබඳ ඇමති සරත් වීරසේකර ''ආගමික අන්තවාදය'' සංකේතවත් කරන ආවරණ වන බුර්කා සහ නිකාබ් ජාතික ආරක්ෂාවට බලපාන බව සඳහන් කරමින් ඒවා තහනම් කරන යෝජනාවත් ඉදිරිපත් කෙළේය.[33] හඳුනාගැනීමට බලපාන යෝජිත මුහුණු ආවරණ තහනම සියලු ප්‍රජාවන්ට අදාල සහ ලිංග භේදයක් නැති බව ආණ්ඩුව පැහැදිලි කෙළේය.[34] 2021 ඔක්තෝබර් මස ( වැඩි වශයෙන්ම මුස්ලිම් මස් වෙළඳුන් විසින් කරන) ගවයන් මැරීම තහනම් කිරීමේ යෝජනාවක් කැබිනට් මණ්ඩලයෙන් අනුමත විය. මෙම යෝජනා ඉදිරියට ගෙන යෑම හෝ ක්‍රියාත්මක කිරීම සිදු නොවූ නමුත් මුස්ලිම් විරෝධී ප්‍රකාශ කිරීමේ වාතාවරණයට දායක වූ අතර මුස්ලිම් ප්‍රජාව තුළ කොන් කරනු ලැබීමේ හැඟීම වැඩි කරවීය.

26. එවැන්ජලික ක්‍රිස්තියානි සහ නිකායකට අයත් නොවන පල්ලි ඉලක්ක කර ගත් රාජ්‍ය නිලධාරීන් ගේ හෝ වෙනත් ඇදහීම් කරන අය ගේ තර්ජන සහ හිරිහැර කිරීම් සහ පුද පූජා කරන ස්ථානවලට බාධා කිරීම ඇතුළත් පහර දීමේ සිද්ධි දිගටම වාර්තා විය.[35]

## ඇ. සිවිල් සමාජය සහ වින්දිතයන් බියවැද්දීම සහ තර්ජනය කිරීම

27. කලින් වාර්තාවල ඉස්මතු කර දැක් වූ සිවිල් සමාජ සංවිධාන ( CSO ) මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ වින්දිතයන් සෝදිසි කිරීමේ සහ හිරිහැර කිරීමේ රටාව විශේෂයෙන්ම රටේ උතුර සහ නැගෙනහිර දිගටම පැවතිණ. මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, සිවිල් සමාජ නියෝජිතයන්, ජනමාධ්‍යවේදීන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට ආරක්ෂක සේවා විසින් තර්ජනය කිරීම, පරික්ෂාව සහ සෝදිසි කිරීම පිළිබඳ චෝදනා මහ කොමසාරිස් කාර්යාලයට දිගටම ලැබෙමින් පවතී. එවැනි සියලු පැමිණිලි අදාල ජාතික යාන්ත්‍රණයකට යොමු කළ යුතුයැයි ආණ්ඩුව අවධාරණය කරයි.[36]

28. සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රියාකාරීන් නිරතුරුවම ඔවුන්ගේ කාර්යාලවලට හෝ නිවෙස්වලට පැමිණ හෝ පොලීසියට කැඳවා කාර්ය මණ්ඩලය, සහ ප්‍රදානක බැංකු විස්තර, ඔවුන්ගේ විදේශ සම්බන්ධතා සහ සංචාරය කළ තැන් හෝ ඔවුන්ගේ සමාජ මාධ්‍ය ගිණුම්වල මුරපද ( Passwords)

[32] https://www.army.lk/news/gigantic-%E2%80%98sanda-hiru-seya%E2%80%99-offered-maha-sangha-immortalizing-memories-%E2%80%98ranaviru%E2%80%99-sacrifices

[33] යෝජිත තහනමට නිකාබ් ද ඇතුළත් කරයි. - The Morning - Sri Lanka News.

[34] NV 64/22, para 50.

[35] 2021 දී ආගමික නිදහසට එරෙහි සිද්ධීන් 77ක් ඇදහීම් පදනම් සංවිධාන වාර්තා කළහ.

[36] NV 64/22 ඡෙදය 64

ගැන විමසීම් සහ ප්‍රශ්න කරනු ලබයි. නිදසුනක් වශයෙන් 2021 දෙසැම්බර් මස උතුරු පළාතේ අවුම වශයෙන් සංවිධාන හතරක කාර්ය මණ්ඩල පොලීසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට 'විමසීම්' සඳහා කැඳවා ඔවුන්ගෙන් පැය ගණනක් ප්‍රශ්න කරන ලදී. පසුගිය වසරවල ඔවුන්ට අරමුදල් සපයන සංවිධාන පිළිබඳ සියලු විස්තර සහ ප්‍රතිලාභීන්ගේ විස්තර ඉදිරිපත් කරන මෙන් දැනුම් දී ඇත. මෙවැනි පරික්ෂාවක් අවශ්‍ය වන්නේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සටන් කිරීමටයැයි ආණ්ඩුව සහතික වේ.

29. සීමා කිරීම් ගණනාවක්ම සිවිල් සමාජ සංවිධානවලට, විශේෂයෙන් උතුර සහ නැගෙනහිර, ඔවුන්ගේ මෙහෙයුම කිරීමේ අවකාශයට බලපායි. සෝදිසි කිරීමෙන් හෝ පරික්ෂාවට ලක්වීමෙන් තොරව වැඩ කිරීමට නොහැකි බවත් කිසියම් ක්‍රියාකාරකමක් කරන්නේ නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දන්වා අනුමැතිය ලබා ගත යුතු පවත් සංවිධාන වාර්තා කරති. ද්‍රව්‍යාත්මක සේවා සැපයීමක් නැති මනෝ සමාජ සහාය වැනි සමහර ක්ෂේත්‍රවල වැඩ විශේෂයෙන් අධෛර්යමත් කෙරේ. බොහෝ විට අරමුදල් නිකුත් කිරීමට පෙර බැංකු, අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අනුමැතිය ලබා ගත යුතුයැයි පැවසීම නිසා සිවිල් සමාජ සංවිධාන මත පරිපාලනමය බාධා පනවන බව සිවිල් සමාජ සංවිධාන මානව අයිතිවාසිකම් කාර්යාලයට දන්වා ඇත.

30. සුප්‍රකට සහ ගරු කටයුතු සිවිල් සමාජ නියෝජිතවරියක් මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම ගැන ආණ්ඩුව මෑතක දී ප්‍රතිචාර දැක්වීම සහ එය එල්ටීටීඊ ප්‍රචාරයට එකතු කිරීම ගැන මහ කොමසාරිස්වරිය කණස්සල්ල පළ කරන්නීය. අතීතයේ මෙවැනි මැදිහත්වීම් ශ්‍රී ලාංකීය මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් තුළ, මානව අයිතිවාසිකම් මණ්ඩලය සමග ඔවුන් සම්බන්ධතාවයක් පැවැත්වීම ද ඇතුළත් බිය දනවන බලපෑමකි.

31. සිවිල් සමාජ සංවිධාන නියාමනය කරන රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය 2021 නොවැම්බර් මස ආරක්ෂක අමාත්‍යාංශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයට මාරු කිරීම සාධනීය වර්ධනයක් ලෙස මහ කොමසාරිස්වරිය සටහන් කරන්නීය. මෙම මාරු කිරීම දැනට පවතින ආරක්ෂණ පිවිසුමේ මූලික වෙනසකට හේතු වනු ඇතැයි ද සිවිල් සමාජය සඳහා වඩාත් දිරිමත් කරවන පරිසරයක් ප්‍රවර්ධනය කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.[37] 1980 අංක 31 ස්වේච්ඡා සමාජ සංවිධාන ( ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) පනතට යෝජිත සංශෝධන ගැන උපදේශනයක් ආරම්භ කළ බව ආණ්ඩුව දන්වා සිටී.[38]

32. විරෝධතා හෝ අනුස්මරණ සඳහා ඇති සැලසුම් හෝ තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග අතීතයේ තිබූ සම්බන්ධතා ගැන විමසීමට බුද්ධි අංශ සහ පොලිස් නිලධාරීන් නොයෙකුත් වර පැමිණීම ඇතුළත් බලධාරීන්ගේ හිරිහැර සහ තර්ජනවලට වින්දිත කණ්ඩායම් ලක් වෙන බවට වාර්තා කීපයක් මානව අයිතිවාසිකම් කාර්යාලයට ලැබී ඇත. ඊට අමතරව පුනරුත්ථාපනය වූ එල්ටීටීඊ සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල් හෝ ගැටුම් පැවති සමයේ එල්ටීටීඊය සමග කිසියම් සම්බන්ධතාවයක් තිබුණේයැයි සැලකෙන කිසිවෙකු නිරන්තර සෝදිසියේ ඉලක්ක වේ. යුක්තිය ඉල්ලා සිටින බොහෝ දෙනකු ජීවතුන් අතර සිටින කාන්තාවන් හෝ පවුල් සාමාජිකයන් වන සන්දර්භයක සහ ඔවුන් ආරක්ෂක හමුදා සහ බලධාරීන් සමග කටයුතු කිරීමේ දී අතිරේක අවදානමකට මුහුණ දෙන නිසා මෙම ප්‍රතිපත්තිවල ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය පැතිමානය ගැන මහ කොමසාරිස්වරිය කණස්සල්ලට පත්වන්නීය. සිවිල් සමාජ සංවිධාන සහ වින්දිතයන්ගේ කණ්ඩායම්, විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ සහ කාන්තා නායකත්වයෙන් යුත් කණ්ඩායම්, සාමය ගොඩනැගීමේ අත්‍යවශ්‍ය හවුල්කරුවන් සේ සැලකිය යුතුය. ඔවුන්ට සාමය

[37] 2021 නොවැම්බර් 17 දිනැති අංක 2254/30 ගැසට් නිවේදනය.

[38] NV 64/22, para 64.

ගොඩනැගීම සහ සංහිඳියාවට අදාල ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට, මතවාදී වශයෙන් පෙනී සිටීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට ඉඩ දිය යුතුය.

33. බලධාරීන් විසින් වින්දිත කණ්ඩායම්, සිවිල් සමාජ සංවිධාන සහ දේශපාලකයන් සාමකාමී උත්සව සහ අනුස්මරණ ක්‍රියාකාරකම් පැවැත්වීමෙන් වැළැක්වීමේ සිද්ධීන් ද ඇත. 2021 මැයි මස මුල්ලිවයික්කාල් යුද්ධය අනුස්මරණය කිරීම සංවිධානය කළ පුද්ගලයන් 27කට එරෙහිව පොලීසිය උසාවියෙන් තහනම් නියෝගයක් ලබා ගත්තේය. උසාවිය ඊට පසු දින තහනම් නියෝගය සංශෝධනය කළ ද මුල්ලිවයික්කාල් සහ අවට ප්‍රදේශය වසා දැමීමේ නියෝගයක් පැන වූ අතර හමුදාවෙන් පිවිසුම් මාර්ගවලට බාධක පැනවීය. පොලීසිය 2021 සැප්තැම්බර් මස අතුරුදහන් වූවන්ගේ පවුල් සංගමයක නායකයාට පෙළපාලි සහ රැස්වීම්වලට සහභාගිවීමෙන් වළක්වන වාරණ නියෝගයක් උසාවියෙන් ලබා ගත්තේය. 2021 දෙසැම්බර් මස පොලිසිය මහනුවර ප්‍රාදේශීය මානව අයිතිවාසිකම් සංවිධානයක් මගින් සංවිධානය කළ උත්සවයක් විවිධ වාර්ගික කණ්ඩායම් අතර අසමගිය ඇති කරනු ඇතැයි සඳහන් කරමින් එය නතර කිරීමට උසාවියෙන් තහනම් නියෝගයක් ලබා ගත්තේය.

## ඉ. අත් අඩංගුවේ දී මිය යෑම්, වධහිංසා සහ වෙනත් හිංසා

34. මහ කොමසාරිස්වරිය කොවිඩ්- 19 වසංගත තත්වය නිසා සිර ගෙවල් තුළ තදබදය අඩු කිරීමට විශේෂයෙන් නඩු විභාගය අපේක්ෂාවෙන් සිටින රැඳවියන් ඇප මත නිදහස් කිරීමට ගත් පියවර ගැන සතුට පළ කරන්නීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිරකරුවන්ගේ සංඛ්‍යාව 2020 ඔක්තෝබර්වල 32,000 සිට 2022 පෙබරවාරි 17 වන විට 18,903 දක්වා අඩු විය.[39] අධිකරණ සේවා කොමිසම ඇප මත නිදහස් කිරීම වඩාත් වැඩි කිරීමට විනිශ්චයකරුවන්ට උපදෙස් නිකුත් කෙළේය. නීතිපතිවරයා ද තම පාවිච්චියට ප්‍රමාණ වූ මත්ද්‍රව්‍ය තබා ගැනීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් පුද්ගලයන් සිරගත කිරීම අඩු කරන මෙන් පොලිසියට උපදෙස් දුන්නේය.[40]

35. පොලිස් අත් අඩංගුවේ දී සහ පොලීසියත් සමග ඇති වූයේයැයි කියන අවි ගැටුම්වලදී නැවත නැවතත් සිදුවන මරණ ගැන මහ කොමසාරිස්වරිය සිය බරපතළ කණස්සල්ල ප්‍රකාශ කරන්නීය. නිවාරණ නියෝග උල්ලංඝනය කෙළේයැයි අත් අඩංගුවට ගත් මොහොමඩ් අලි ඛාන් කොළඹ අසළ පානදුර වත්තල්පොළ දී පොලිස් අත් අඩංගුවේ සිටිය දී මිය ගියේය. ධාවනය වන පොලිස් වාහනයෙන් ඉවතට පැනීමෙන් ඔහු මිය ගිය බව පොලීසිය වාර්තා කරන අතර ඔහුගේ පවුල පවසන්නේ පොලිසිය විසින් පහර දී ඔහු මරා දමා ඇති බවය. වාර්තාවන ආකාරයට මත් ද්‍රව්‍ය සම්බන්ධ සිද්ධීන් ගැන (පිළිවෙළින්) 2021 ජුනි මස මඩකලපුවේ දී සහ 2021 ඔක්තෝබර් මස මන්නාරමේ දී අත් අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනෙකු ( චන්ද්‍රන් විදූෂන් සහ රම්සාන් ) අත් අඩංගුවට ගෙන පැය ගණනක් ඇතුළත මිය ගොස් ඇත. 2021 ජුලි 18 දින මැර කල්ලි නායකයෙකු වන ලලිත් වසන්ත පින්තෝ විශේෂ කාර්ය සාධක බලකාය විසින් අත් අඩංගුවට ගැනීමට විරෝධය පෑමේ දී මරා දමා ඇත. 2022 ජනවාරි 11 වංචා කිරීමේ චෝදනා මත අත් අඩංගුවට ගෙන කොළඹ කොටුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා සිටි රාජපක්ෂ මුදියන්සේලාගේ මැණිකේ එම ගොඩනැගිල්ලේ පස් වැනි මහලින් බිමට පැන මිය ගියාය. පොලීසිය වාර්තා කරන ආකාරයට ඇය සිය දිවි නසා ගෙන ඇත.

[39] NV 64/2022, para 68
[40] NV 457/2021, page 19.

36. අඩුම වශයෙන් අවස්ථා දෙකක දී නීතිඥ සංගමය සහ පුද්ගලික නීතිඥයන් රැඳවියන්ගේ ජීවිත අනතුරේ බව දන්වා සිටීම ගැන මහ කොමසාරිස්වරිය බරපතළ අවධානය යොමු කරන්නීය. නිදසුනක් වශයෙන් වාර්තා වන ආකාරයට නොවැම්බර් 16 දින කලුතර දී වෙනත් අපරාධයකට යොදා ගත්තේයැයි කියන ආයුධ සොයා ගැනීමට ගෙන යැමේ දී හේවා ලුනුවිලගේ ලසන්ත, පොලිස් නිලධාරීන්ට පහර දීම නිසා පොලීසිය විසින් මරා දමා ඇත. ඊට දිනකට පෙර ලසන්තගේ නිතිඥයා නීතිඥ සංගමය අමතා තම සේවා දායකයාට ජීවිත අනතුරක් පවතින බව දැනුම් දුන්නේ ය. නීතිඥ සංගමය ප්‍රකාශයක් නිකුත් කරමින් සිදුවිය හැකි මරණය ගැන පොලිස්පති සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට අනතුරු හැඟ වූ බවද, මෙම සිද්ධියේ '' නීතියෙන් පරිබාහිරව සිදු කරන ඝාතනයක සියලු ලක්ෂණ පවතින'' බව ද සඳහන් කෙළේය.[41] මෙවැනි තවත් සිද්ධීන් දෙකක දී මැයි 11 සහ 12 වැනි දින මාලන් මබුලා සහ තාරක පෙරේරා වීරසේකර පිළිවෙළින් නවගමුව සහ මීන්ගාව ( බටහිර පළාත) විමර්ශන කටයුතු සඳහා රැඳවුම් භාරයෙන් ඉවතට ගෙන යැමේ දී වෙඩි තබා මරා ඇත.

37. 2021 ජනවාරි සිට 2021 නොවැම්බර් දක්වා[42] පොලිස් අත් අඩංගුවේ සිටිය දී නම දෙනකු මිය ගොස් ඇති අතර පොලිස් නිලධාරීන් දෙදෙනකුට නඩු පවරා ඇත. පොලිස් නිලධාරීන් හත් දෙනක් අත් අඩංගුවේ සිටිය දී සිදු වූ මරණ ගැන විනය පියවරවලට මුහුණ දී සිටිති. එහෙත් ඒ කුමන සිද්ධීන් ගැන ද යන්න පැහැදිලි නැත.[43] මෙම අපරාධ සම්බන්ධයෙන් පුද්ගල වගකීම් පැවරීමට සහ පවුල්වලට හානිපූරණ ලබා දීමට අමතරව මෙම සිද්ධීන් පිළිබඳව පොලිස් සේවය තුළ ඇති රටාව සහ කිසියම් අණ දීමේ වගකීම පැවතීමක් හඳුනා ගැනීමට ස්වාධීන විමර්ශනයක් කිරීම සුදුසුයැයි මහ කොමසාරිස්වරිය විශ්වාස කරයි.

38. පොලීසිය විසින් තාඩණ පීඩණ සහ වධ හිංසා පැමිණවීම් 2021 වසරේ ද වාර්තා විය. වාර්තා වූ ආකාරයට මත්ද්‍රව්‍ය අධි මාත්‍රාවක් නිසා පොලිස් අත් අඩංගුවට ගෙන ජුනි 3 වැනි දා මිය ගිය චන්ද්‍රන් විදූෂන්ගේ පවුලේ අය පවසන ආකාරයට ඔහු රැගෙන යැමට පෙර ගසක බැඳ දරුණු ලෙස පහර දී ඇත. හමුදා නිලධාරීන් විසින් ද තාඩණ පීඩණ සහ වධ හිංසා පමුණුවා ඇතැයි වාර්තා වේ. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකා හමුදාවේ නිලධාරීන් විසින් යාපනයේ දී තමාට දරුණු ලෙස පොළුවලින් පහර දුන්නේයැයි ධීවරයෙකු චෝදනා කරයි. වාර්තාවන ආකාරයට නොවැම්බර් 27 වැනි දා ජනමාධ්‍යවේදියෙකු මුල්ලිවයික්කාල් හි පාර අසළ නාම පුවරුවක් ඡායාරූප ගත කරමින් සිටිය දි ශ්‍රී ලංකා හමුදාවේ නිලධාරීන් විසින් පහර දී ඇත. වවුනියාවේ ජෝසප් කඳවුරේ දී ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය විසින් ප්‍රශ්න කිරීමේ දී රැඳවුම්කරුවන්ව වධ හිංසා සහ තාඩණ පීඩණ පමුණුවන බව වාර්තාවන්නේයැයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට එරෙහි නීතිඥයෝ පවසති.

39. 2021 සැප්තැම්බර් මස බන්ධනාගාර කළමනාකරණ සහ සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍ය ලොහාන් රත්වත්ත එල්ලුම් ගස සිය මිතුරන් කණ්ඩායමකට පෙන්වීමට කොළඹ බන්ධනාගාරකට ඇතුළු වූ බවත් පසුව අනුරාධපුරයේ බන්ධනාගාරකට ඇතුළු වී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ඇති දෙමළ සිරකරුවන් දෙදෙනෙකු දණ ගස්වා ඔවුන් මරා දමන බවට තර්ජනය කළ බවත් පුළුල්ව වාර්තා විය. රත්වත්ත බන්ධනාගාර රාජ්‍ය අමාත්‍ය තනතුරෙන් ඉල්ලා අස් වුවද මැණික් සහ ස්වර්ණාභරණ රාජ්‍ය ඇමති තනතුරේ සිටී.

[41] ප්‍රකාශනයː පොලිස් අත් අඩංගුවේ දී සැකකරුවෙකු මරා දැමීම ශ්‍රී ලංකා නීතිඥ සංගමය
[42] NV 457/2021, page 22.

[43] NV 457/2021, page 22.

40. වධ හිංසා වැළැක්වීමේ පියවරක් වශයෙන් ආණ්ඩුව ඉස්මතු කර දැක් වූ ආකාරයට අඩුම වශයෙන් මාසයකට වරක් හෝ මහෙස්ත්‍රාත්වරයෙකු පුද්ගලිකවම පොලිස් ස්ථානවලට ගොස් පොලිස් අත් අඩංගුවේ සිටින සැකකරුවන් අත් අඩංගුවට ගැනීමේ දී සහ ඉන් පසුව වධ හිංසාවන්ට හෝ තාඩණ පීඩණවලට ලක්ව ඇත්දැයි විමසා බැලීම අවශ්‍ය කෙරෙන ආකාරයට අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කර ඇත [44] මෙම විකල්ප පරීක්ෂණ ක්‍රමය සීමිත කාලය සහ හැකියාව නිසා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම අපහසු විය හැකියැයි සැකයක් පවතී. මේ අතර වධ හිංසාවන්ට එරෙහි සන්ධානයේ වෛකල්පික ගිවිසුම යටතේ ජාතික වැළැක්වීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීමේ වැඩි දුර ප්‍රගතියක් දක්නට නැත. 2016 වධ හිංසාවන්ට එරෙහි කමිටුව විසින් ශ්‍රී ලංකාව පිළිබඳ කරන ලද සවිස්තරාත්මක නිර්දේශ සිහි ගන්වන මහ කොමසාරිස්වරිය මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ස්ථිර පියවර ගන්නා මෙන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.[45]

## ඊ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

41. 2022 පෙබරවාරි 10 දින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ගෙන එන සංශෝධන කෙටුම් පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණ. මෙය සවිස්තරාත්මක ව්‍යවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම සඳහා වූ මූලික පියවරක් බව ආණ්ඩුව දැනුම් දී ඇත. මෙම මූලික පියවරවල වැදගත්කම පිළිගන්නා මහ කොමසාරිස්වරිය, රැඳවුම් ස්ථාන බැලීමට යෑමට මහෙස්ත්‍රාත්ට ඇති බලය වැඩි කිරීම, නඩු විභාග කඩිනම් කිරීම මෙන්ම ප්‍රකාශනවලට සීමා පැනවෙන 14 වන වගන්තිය ඉවත් කිරීම වැනි යෝජිත සංශෝධන සැලකිල්ලට ගනී. කෙසේ වුවත් යෝජිත සංශෝධනවල අනෙකුත් කොටස් අන්තර්ජාතික මානව අයිතිවාසිකම්වලට ඇති බැඳීම්වලට සම්පූර්ණයෙන්ම අනුකූල නොවන අතර හිතුවක්කාර රඳවා ගැනීම් සහ වධ හිංසා පැමිණවීම ඇතුළත් වාර්තා වන ආකාරයට මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට තුඩු දෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වඩාත් ගැටලු සහිත සමහර ප්‍රතිපාදන එසේම පවතී. ඊට නීතිය වෙනස් කොට හෝ හිතුවක්කාර ලෙස යොදා ගැනීමට ඉඩ සැලසෙන ආකාරයට ත්‍රස්තවාදය අසාධාරණ සහ අපහැදිලි සේ නිර්වචනය කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නීතිඥයෙකුගේ ඉදිරිපත්වීමක් නැතිව නීතිය බලාත්මක කරන නිලධාරියෙකු ඉදිරියේ කරන පාපොච්චාරණ පිළිගත හැකි කරවීම, ඒවා ත්‍රස්තවාදය වැළැක්වීමේ නඩුවලදී බොහෝ විට උසාවියේ දී ප්‍රාථමික සාක්ෂි වශයෙන් පිළිගැනීම සහ මාස 12ක් දක්වා දිර්ඝ කාලීන පූර්ව පරිපාලන සහ පූර්ව නඩු විභාග යටතේ රඳවා ගැනීම සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ප්‍රමිතීන්ට අනුකූල නොවන ආකාරයෙන් නිලධාරීන්ට නඩු පැවරීමෙන් මුක්තිය ලබා දීම සඳහා වූ ප්‍රතිපාදන ඇතුළත් වේ.

42. මහ කොමසාරිස්වරිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ යාන්ත්‍රණ වසර ගණනාවක් තිස්සේ ඉදිරිපත් කළ විශ්ලේෂණ සහ නිර්දේශවලට, විශේෂයෙන්ම 2021 දෙසැම්බර් 9 දින තම සන්නිවේදනයෙන්, අධිකාරියක් ලබා දුන් විශේෂ ක්‍රියා පටිපාටි හතෙන් හඳුනා ගත් මූලික පදනම් ප්‍රමිතීන් පහට පූර්ණ සැලකිල්ල යොමු කරන මෙන් ආණ්ඩුවෙන් සහ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටී. ඒවා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අන්තර්ජාතික නීතිමය බැඳීම්වලට අනුකූල වීමට සංශෝධනය කිරීම සහතික කිරීම සඳහා වූ ''අවශ්‍ය වූ පූර්ව නිර්දේශ'' ලෙස සැලකේ.[46]

---

[44] Ibid age 16
[45] A/HRC/34/54/Add.2, paras 115-122
[46] OL LKA (7.2021)

43. මේ අතර ආණ්ඩුව මෙම පනත යටතේ පුද්ගලයන් රඳවා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම දිගටම සිදු කරයි. රටේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් බැඳීම්වලට සම්පූර්ණයෙන්ම අනුකූල වන ව්‍යවස්ථාවකින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කරන තෙක් විලම්බනය කරන මෙන් ආණ්ඩුවෙන් කළ තම ඉල්ලීම මහ කොමසාරිස්වරිය නැවතත් අවධාරණය කරයි. ආණ්ඩුවේ දත්ත අනුව 2021 දෙසැම්බර් 2 වන විට පුද්ගලයන් 333ක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ඇත. ඉන් 16ක් වැරදිකරුවන් ලෙසනම් කොට දඬුවම් කර ඇති අතර11ක් අභියාචනා ඉදිරිපත් කර ඇත. සෙසු අය සැකකරුවන් වශයෙන් රඳවා ගෙන සිටී.[47] ජුනි 24 සිට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රැඳවියන් 81ක් නිදහස් කර ඇත.[48] කැපී පෙනෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ නඩු අතරින් මාස දහ අටක් රඳවා ගෙන සිටි අහ්නාෆ් ජසීම් 2021 දෙසැම්බර් 13 වැනි දා ඇප මත නිදහස් කරන ලදී. 2020 අප්‍රේල් 14 දින සිට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටි නීතිඥ හිජාස් හිස්බුල්ලා 2022 පෙබරවාරි 7 මහාධිකරණයෙන් ඇප මත නිදහස් මත නිදහස් කරනු ලැබිණ.

44. 2021 ජුනි මස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිර ගත කොට දඬුවම් කාලය අවසන් වීමට ආසන්නව සිටි සිරකරුවන් 16ක් ජනාධිපති සමාව යටතේ නිදහස් කෙරිණ. 2021 අගෝස්තු 24 වැනි දා රැඳවියන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පුනරීක්ෂණය සඳහා අයැදුම් කළ හැකි විශ්‍රාමික අග්‍ර විනිශ්චයකරුවෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ත්‍රි පුද්ගල උපදේශක මණ්ඩලයක් පත් කරන ලදී.[49]

45. එල්ටීටීඊ චිත්‍ර හෝ දෙමළ ජාතික ප්‍රතිරූප ඇතුළත් යුද්ධයේ වින්දිතයන් සැමරීමේ සමාජ මාධ්‍ය ප්‍රකාශ හුවමාරු කර ගැනීම නිසා අඩුම වශයෙන් පුද්ගලයන් 70ක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන ඇතැයි වාර්තාවලින් දැක්වේ. මැයි 18 වැනි දා අනුස්මරණ උත්සවයක් සංවිධානය කිරීම නිසා මඩකලපුවේ දී පුද්ගලයන් 10ක් පොලීසිය විසින් අත් අඩංගුවට ගත් අතර අවසානයේ දී ඔවුන් ඇප මත නිදහස් කරන ලද්දේ දෙසැම්බර් 8 වැනි දිනය. ජනමාධ්‍යවේදියෙකු වන මුරුගපිල්ලෙයි කොකුලදාසන් ඔහුගේ සමාජ මාධ්‍යයේ එල්ටීටීඊ නායකයාගේ ඡායාරූප පළවීම නිසා 2020 නොවැම්බර් මාසයේ සිට මාස 15ක් රඳවා ගෙන සිටියේය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම සීමා කෙරෙන සහ ඡායාරූප ළඟ තබා ගැනීම වැනි සිද්ධීන් ඇගයීමේ දී වඩාත් වැඩි අභිමතයක් යොදා ගැනීම පිළිබඳව 2021 ඔක්තෝබර් 23 දින පොලිස්පති නිකුත් කළ මාර්ගෝපදේශයක් ආණ්ඩුව මහ කොමසාරිස් කාර්යාලයට ද ලබා දෙන ලදී.[50]

46. 2021 මාර්තු මස ප්‍රචණ්ඩ අන්තවාදය සම්බන්ධයෙන් ''පුනරුත්ථාපන'' කාර්ය සඳහා කිසියම් නීතිමය ක්‍රියා පටිපාටියක් නොමැතිව වසර දෙකක් දක්වා කාලයක් පුද්ගලයන් හිතුවක්කාරලෙස පරිපාලනමය රඳවා ගැනීමට ඉඩ සැලසෙන ''රැඩිකල්වීම අත්හැරීමේ'' ( De-radicalization) නව රෙගුලාසි නිකුත් කරන ලදී.[51] නිසි අධිකරණ ක්‍රියාවලියකට එලදායීව පිවිසීමේ සහතිකයක් නොමැතිව මෙම රෙගුලාසි, හිතුවක්කාර ලෙස රඳවා ගනු ලබන පුද්ගලයන්ගේ, විශේෂයෙන් ආගමික සහ වාර්ගික සුළුතරයේ අයිතිවාසිකම් සහ නිදහස අවදානමට පත් කරනු ඇතැයි ද දේශපාලන විසම්මුතිය සීමා කරනු ඇතැයි ද ත්‍රස්තවාදය පිටු දකිමින් මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වූ විශේෂ වාර්තාකරු සහ වෙනත්

---

[47] NV 457/2021, පිටුව 15

[48] NV 64/2022, ඡේදය 80

[49] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 13 වගන්තිය යටතේ උපදේශක මණ්ඩලයක් සඳහා ප්‍රතිපාදන තිබුණ නමුත් කිසි විටෙක එය ස්ථාපනය කෙළේ නැත.

[50] NV 457/2021 15 පිටුව

[51] 2021 මාර්තු 12 අංක 2218-68 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය http://www.documents.gov.lk/files/egz/2021/3/2218-68_E.pdf.

විශේෂඥයෝ අවවාද කළහ.[52] ශ්‍රේෂ්ඨාධිකරණය එම රෙගුලාසිවලට එරෙහි පෙත්සම් සලකා බලන තෙක් සිවිල් සමාජ සංවිධාන ඒවා ක්‍රියාත්මක කිරීම නතර කිරීමේ නියෝගයක් ලබා ගත්හ.

## III සංහිඳියාව සහ වගවීමේ ප්‍රගතිය

### අ. සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණය

47. ආණ්ඩුව 40/1 යෝජනාවේ සම අනුග්‍රාහකත්වයෙන් සහ ඊට අදාල 34/1 සහ 30/1 යෝජනාවලින් ඉවත්වීමට තීරණය කළ විට '' සියල්ලන් ඇතුළත් කර ගන්නා, දේශීය වශයෙන් සැලසුම් කොට ක්‍රියාත්මක කරන සංහිඳියා සහ වගවීමේ ක්‍රියාවලියක්'' පවත්වා ගෙන යෑමේ අදහස ප්‍රකාශ කෙළේය.[53] වසර දෙකක් ගත වුවද ආණ්ඩුව වගවීම සහ සංහිඳියාව කෙරේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ කිසියම් විශ්වාසයක් තැබිය හැකි නව මාර්ග සිතියමක් තවම ඉදිරිපත් කර නැත. ''කලින් පත් කරන ලද ශ්‍රී ලංකා විමර්ශන කොමිසම් සභාවල වාර්තා නිරීක්ෂණයට සහ ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්වය තක්සේරු කිරීමට සහ නව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට ගැලපෙන අකාරයට ඒවා ක්‍රියාත්මක කිරීමට ලබා දිය හැකි පියවර යෝජනා කිරීමටත්'' ජනාධිපති 2020 නොවැම්බර් මස විමර්ශන කොමිසමක් පත් කෙළේය. එම කොමිසමේ දෙවැනි අන්තර්වාර වාර්තාව 2022 පෙබරවාරි මස ජනාධිපතිට භාර දී ඇත.[54]

48. කලින් ආණ්ඩුව සංක්‍රාන්තික යුක්තිය පිළිබඳව ස්ථාපනය කළ ව්‍යුහයන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (OMP ) සහ හානිපූරණ කාර්යාලය ( OfR ) තවමත් පවතී. කෙසේ වුවත් ඒවා විශේෂයෙන් සාමාජිකත්වයේ කරන ලද වෙනස්කම්වලින් පසුව වින්දිතයන්ගේ විශ්වාසය සාක්ෂාත් කර ගැනීමේ අරගලයක යෙදී සිටී.

49. 2021 දෙසැම්බර් මස අතුරුදහන් වූ තැනැත්තන් පුද්ගලයන් පිළිබඳ කාර්යාලයට (OMP ) නව සභාපතිවරයෙකු සහ කොමසාරිස්වරුන් පත් කරන ලදී. ආණ්ඩුව පවසන ආකාරයට මෙම කාර්යාලය 2000 සිට 2020 දක්වා මුල් අදියරේ දී ලැබුණු පැමිණිලි 6025 සත්‍යාවේෂණ කටයුතු කරමින් සිටී. එම ලිපි ගොනු 6025 පිළිබඳව අතිරේක තොරතුරු දැන ගැනීම සඳහා අදාල බලධාරීන් සමග හුවමාරුකර ගනිමින් සිටි. පැමිණිලි 4200ක් සම්බන්ධයෙන් තවත් ලිපි ලේඛන අවශ්‍ය බව මෙම කාර්යාලය තීරණය කර ඇති අතර තම පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමට තවත් විස්තර අවශ්‍ය බව පවුල් 3230කට දැනුම් දී ඇත.[55] 2021 නොවැම්බර් මස ආණ්ඩුව විමර්ශනය කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට (OMP ) දක්නට නැති බවට සහතිකයක් හෝ මරණ සහතිකයක් නිකුත් කළ හැකිවනු සඳහා පරීක්ෂණ මණ්ඩල හතරක් පිහිටුවන ලද බව වාර්තා කෙළේය.[56] මෙම සත්‍යාවේෂණය සත්‍යය තහවුරු කර ගැනීමේ සහ යුක්තිය සහතික කිරීමේ සහ පවුල්වලට සහනය සැලසීමේ සවිස්තරාත්මක පියවරකට වඩා සිද්ධි

---

[52] OL LKA (3.2021)

[53] මානව අයිතිවාසිකම් මණ්ඩලයේ හතළිස් තුන්වැනි සැසියේ ඉහළ මට්ටමේ කොටසේ දී 2020 පෙබරවාරි 26 දින ශ්‍රී ලංකාවේ විදේශ සම්බන්ධතා ඇමති ගරු දිනේෂ් ගුනවර්ධන

[54] NV 64/22 ඇමිණුම

[55] NV 457/2021 7 පිටුව

[56] Ibid

සංඛ්‍යාව අඩු කිරීමට සහ ලිපි ගොණු වැසීම අරමුණු කර ගත් බවක් පෙනෙන්නේයැයි මහ කොමසාරිස් කාර්යාලය කණස්සල්ලට පත් වේ.

50. බහුතරයක් කාන්තාවන් නියෝජනය වන අතුරුදහන් වූවන්ගේ පවුල්වල දිගටම පවතින අවදානම් තත්වය ගැන මහ කොමසාරිස්වරියගේ බරපතළ කණස්සල්ල යොමු වේ. තම ආදරණීයයන් ගේ ඉරණම සහ සිටින තැන නොදත් නිසා ඔවුන්ට ඇති දුක සහ වේදනාවට අමතරව ඔවුන්ට තම ජීවිත පවත්වා ගැනීමට බලාපොරොත්තු සුන් වූ ආර්ථික සහ සමාජයීය ප්‍රතිඵල සමග අරගලයේ යෙදීමට සිදු වේ. කොවිඩ්-19 ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතා වැඩි කළ අතර හුදකලාව ද වැඩි කරවීය. මෙවැනි සන්දර්භයක ආරක්ෂක අංශවල සෝදිසිමත් භාවය සහ හිරිහැර කිරීම් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට බාධා කිරීම්වලින් සිදු වන්නේ ඔවුන් මුහුණ දෙන අසාධාරණය වඩාත් වැඩිවීම පමණි. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සත්‍යය, යුක්තිය, හානිපූරණය, සහ නැවත සිදුනොවන බවට සහතිකයක් ලබා ගැනීමට අයිතියක් ඇති අතර ඔවුන්ගේ වේදනාව පිළිගෙන, වින්දිතයන්ගේ ඉරණම හෝ සිටින තැන ඉක්මණින් තීරණය කොට, හානිපූරණ ලබා දී වැරදිකරුවන් නීතිය ඉදිරියට පමුණුවන ලෙස මහ කොමසාරිස්වරිය ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.

51. 2021 දී හානිපූරණ කාර්යාලයට කටයුතු සම්පූර්ණ කළ ඉල්ලීම් සඳහා ගෙවීමට ලංකා රුපියල් දශ ලක්ෂ 800ක් ( එ.ජ. ඩොලර් දශලක්ෂ 3.9ක්) වෙන් කළ අතර එම කාර්යාලය පවසන ආකාරයට ඉන් ලංකා රුපියල් දශ ලක්ෂ 400ක් පාවිච්චි කර ඇත.[57] අවාසනාවකට මෙන් මහ කොමසාරිස් වෙත ලැබී ඇති දත්ත ප්‍රමාණවත්ව වෙන් කර නැති නිසා මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට අදාල වන්නේ කුමන ගෙවීම් ද යන්න පැහැදිලි නැත. හානිපූරණ ප්‍රතිපත්තිය පෙබරවාරි 9 පාර්ලිමේන්තුවේ සභා ගත කර ඇත.[58] හානිපූරණ කාර්යාලය ජීවන මාර්ග සහ මනෝ සමාජයීය සහාය සඳහා නියමු වැඩ සටහන් ගොඩනගමින් සිටින බව ආණ්ඩුව මහ කොමසාරිස් කාර්යාලයට දන්වා ඇත.

52. ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ කාර්යාලය ( ONUR ) රට පුරාම සාමය සහ සංහිඳියා වැඩමුළු දිගටම පවත්වා ගෙන යයි.[59] මෙම කාර්යාලය සිවිල් සමාජය සහ දේශපාලන පක්ෂ සමග උපදේශනයක් හරහා ''ජාතිය සුව කිරීමේ, සාමය ගොඩනැගීමේ සහ සංහිඳියාව සඳහා උපාය මාර්ගික මාර්ග සිතියමක්'' සකස් කරමින් සිටින බවද වාර්තා වේ.[60] සංහිඳියාව සාක්ෂාත් කර ගත හැකි වන්නේ සවිස්තරාත්මක සංක්‍රාන්තික යුක්ති පියවරවලින් සහාය ලබන විට පමණක් බව අවධාරණය කරන මහ කොමසාරිස්වරිය 2017 දී සංහිඳියා පියවර පිළිබඳ කාර්ය සාධක බලකාය විසින් පවත්වන ලද ඉතාමත් අර්ථාන්විත ජාතික උපදේශනයේ වාර්තාව සිහිපත් කරන්නීය. එය වින්දිතයන්ගේ සහ වෙනත් පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා පිළිබඳ මාර්ගෝපදේශයක් සේ තවමත් පවතී.[61]

## ආ. සංකේතාත්මක සිද්ධීන් පිළිබඳ මුක්තිය

53. අධිකරණය ඉදිරියේ ඇති සංකේතාත්මක මානව අයිතිවාසිකම් පිළිබඳ නඩුවල දිගටම ප්‍රගතියක් නැතිවීම පමණක් නොව සමහර සිද්ධීන්වල පියවර ආපසු ගැනීම ගැන මහ කොමසාරිස්වරිය බරපතළ කණස්සල්ල පළ කරයි. 2008 දී සහ 2009 දී පුද්ගලයන් 11ක් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩට එරෙහිව ඇති චෝදනා තවදුරටත් පවත්වා ගෙන නොයෑමට තීරණය කළ බව නීතිපති 2021 අගෝස්තු මස අධිකරණයට

[57] හානිපූරණ කාර්යාලය, වන්දි ගෙවීම් 2022 ජනවාරි දක්වා යාවත්කාලීන කිරීම ( NV 16/22)
[58] NV 457/2021 8 පිටුව
[59] එම 28 පිටුව
[60] එම
[61] See http://war-victims-map.org/wp-content/uploads/2017/02/CTF-Final-Report-Volume-I-Nov-16.pdf

දැන් වූයේය. තමා සාවද්‍ය ලෙස සම්බන්ධ කර ඇතැයි පදනම යටතේ අභියාචනා අධිකරණයට රිට් අයැදුම් පතක් ඉදිරිපත් කළ කරන්නාගොඩ අන්තර්කාලීන සහනයක් ලෙස තහනම් කිරීමේ නියෝගයක් ලබා ගත්තේය.[62] වින්දිතයන්ගේ පවුල්වල අය මෙම අභියාචනා අධිකරණයේ තීරණය අභියෝගයට ලක් කර ඇති අතර එහි විභාගය 2022 අප්‍රේල් මස පැවැත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.[63] වෙනත් නාවික හමුදා නිලධාරීන් 14ට එරෙහි නඩු විභාගය දිගටම පැවැත්වෙන අතරතුර[64] 2021 දෙසැම්බර් මස කරන්නාගොඩ වයඹ පළාතේ ආණ්ඩුකාරයා ලෙස පත් කෙරිණ. 2005 නත්තල් පූජාවක දී මරා දමන ලද පාර්ලිමේන්තු ජෝසප් පරරාජසිංහම් පිළිබඳව චූදිතයන් පස් දෙනකුට එරෙහි තවත් සංකේතාත්මක නඩුවක් පවත්වා ගෙන නොයන බව නීතිපති 2021 ජනවාරි මස මඩකලපුව මහාධිකරණයට දැන් වූයේය.

54. 2022 ජනවාරි 12 කොළඹ මහාධිකරණය 2021 නොවැම්බර් 9 දින වැලිකඩ බන්ධනාගාරයේ හටගත් ගැටුම් කෝලාහලවලින් සිරකරුවන් විසිහත් දෙනකු මරණයට පත්වීමට හේතු වූ සිද්ධීන් පිළිබඳව මනුෂ්‍ය ඝාතනය සහ මනුෂ්‍ය ඝාතනය කිරීමට කුමන්ත්‍රණය කිරීම ඇතුළත් චෝදනා 33 ක් ඉදිරිපත් කර තිබූ නිලධාරීන් තිදෙනකු සම්බන්ධයෙන් තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී.[65] පළමු චූදිත මත්ද්‍රව්‍ය කාර්යංශයේ පොලිස් පරීක්ෂක නියොමාල් රංගජීව සියලු චෝදනාවලින් නිදහස් කරන ලදී. දෙවන සැකකරු වැලිකඩ මැගසින් බන්ධනාගාරයේ හිටපු අධිකාරි ළමාහේවගේ එමිල් රන්ජන් වැරදිකරු බව තීන්දු කිරීමෙන් මරණ දඬුවම නියම කෙරිණ. තුන්වැනි සැකකරු බන්ධනාගාරයේ බුද්ධි ඒකකයට සම්බන්ධව සිටි, ඉන්දික සම්පත්, උසාවිය මග හැර සිටින අතර ඔහු පැමිණීමෙන් තොරව නඩුව විභාග වනු ඇත. මෙම සිද්ධියට සම්බන්ධ අනෙකුත් ආරක්ෂක බලකායන්ට එරෙහිව කිසිම පියවරක් ගෙන ඇති බවක් නොපෙනේ.

55. 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් සහ ආගමික නායකයෝ වින්දිතයන් සඳහා සත්‍යය, යුක්තිය සහ හානිපූරණයත් මෙම ප්‍රහාර සිදුවීමට ඉඩ සැලසුන වාතාවරණය, විශේෂයෙන්ම ආරක්ෂක අංශවල භූමිකාව, පිළිබඳ පූර්ණ විස්තරයක් කඩිනමින් ඉල්ලා සිටිති. ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසමේ සම්පූර්ණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර නැත. එහෙත් ප්‍රධාන පෙළ නිලධාරීන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම නිර්දේශ කර ඇතැයි දැන ගැනීමට ඇත. 2021 ඔක්තෝබර් 4 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ සැකකරුවන් 25 දෙනකුට චෝදනා පත්‍ර ඉදිරිපත් කළ අතර ඒවා මහාධිකරණයේ විභාග වෙමින් පවතී. තවත් නඩු අටක් සම්බන්ධයෙන් කොළඹ, කෑගල්ල සහ පුත්තලම යන මහාධිකරණවල චෝදනා ගොණු කර ඇත. ක්‍රිස්තියානි ප්‍රජාව 2022 ජනවාරි 11 බොරැල්ල සාන්ත අන්තෝනි පල්ලියේ ඇති වූ සිද්ධියකින් බලවත්ව කලබලයට පත්ව සිටිති. යුක්තිය ඉල්ලා කෙරෙන ව්‍යාපාරයේ කොටසක් වශයෙන් පැවැත්වීමට නියමිත රැස්වීමට දින ගණනකට පෙර පල්ලිය තුළ තිබී පුපුරා නොගිය අත් බෝම්බයක් සොයා ගන්නා ලදී. පොලිසිය මුලින්ම පල්ලියේ සිටි කීප දෙනකු අත් අඩංගුවට ගෙන ඇති නමුත් විමර්ශනය අකාර්යක්ෂම සහ අසම්පූර්ණයැයි විවේචන එල්ල වී ඇත.

56. වෙනත් සංකේතාත්මක නඩු ( කලින් වාර්තාවල ඉස්මතු කරන ලද) කීපයක් විභාග වෙමින් පවතින නමුත් මුල් වරට අභිචෝදනා ඉදිරිපත් කිරීමෙන් දශකයක් හෝ ඊට වැඩි කාලයක් උසාවියේ දිග් ගැසෙමින් පැවතීම ගැන මහ කොමසාරිස්වරිය සිය කණස්සල්ල පළ කරයි.[66] දිගු කලක් තිස්සේ පවතින මෙම නඩු ඉල්ලා අස් කර ගැනීමට මෑතක දී නීතිපති සිය අභිමතය යොදා ගැනීම ඔහුගේ කාර්යාලයේ ස්වාධීනත්වය ගැන හා වගවීම සෙවීමට ආණ්ඩුවේ ඇති කැපවීම ගැන බරපතළ සැකයක් ඇති කරවයි. පසුගිය වසරවල බොහෝ නඩු සම්බන්ධයෙන් පොදුවේ ප්‍රගතියක්

---

[62] NV 13/2022.20 January 2022

[63] NV 64/2022, පෙබරවාරි 22 97 ඡේදය

[64] NV 457/2021 පිටුව 2

[65] A/HRC/34/29 ඡේදය 32

[66] බලන්න A/HRC/43/19, ඡේද 21 සහ A/HRC/46/20 ඡේද 49- 50

නොමැතිවීම සහ වෙනත් නඩු කීපයක් සම්බන්ධයෙන් පියවර ආපසු ගැනීම නිසා මහ කොමසාරිස්වරිය බලවත්ව කම්පාවට පත් වේ. ඉන් පෙන්නුම් කරන්නේ නොකඩවාම වරදකරුවන්යැයි සැලකෙන පුද්ගලයන් රජයේ නියෝජිතයන් වන විට අපරාධය සිදු කළ පුද්ගලයන්ට නඩු පැවරීමට සහ දඬුවම්දීමට ආණ්ඩුවේ ඇති නොහැකියාව සහ අකමැත්ත යි.

## IV 46/1 යෝජනාවේ අනෙකුත් පැති ක්‍රියාත්මක කිරීම

57. දේශීය යාන්ත්‍රණවලින් වගවීම කෙරේ ප්‍රගතියක් දක්නට නොලැබීම නිසා 46/1 යෝජනාවෙන් '' තොරතුරු සහ සාක්ෂි එකතු කිරීම, සංග්‍රහ කිරීම, විශ්ලේෂණය සහ සංරක්ෂණය කිරීමට සහ අනාගත ක්‍රියා මාර්ග සඳහා ගත හැකි උපාය මාර්ග ගොඩනැගීමට, වින්දිතයන් සහ ජීවත් වන්නවුන් වෙනුවෙන් පෙනී සිටීමට සහ නිසි අධිකරණ බලයක් සහිත සාමාජික රටවල් ඇතුළුව අදාල අධිකරණ සහ වෙනත් ක්‍රියා පටිපාටිවලට ආධාර කිරීමට මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ ධාරිතාව ශක්තිමත් කිරීමට'' තීරණය කර ඇත.[67] මෙම වගවීමේ මැන්ඩේට් බලයෙන් මහ කොමසාරිස් කාර්යාලයට මානව අයිතිවාසිකම් මණ්ඩලයේ සාමාජිකයන්ට සහ අන්තර්ජාතික ප්‍රජාවට වින්දිතයන්ට ආධාර කිරීමට සහ පරිපූරක උපාය මාර්ග හරහා ශ්‍රී ලංකාවේ සිදු කරන ලද බරපතළ අන්තර්ජාතික අපරාධ සඳහා වගවීම සොයා යෑමට වැදගත් අවස්ථාවක් ඉදිරිපත් කරයි.

58. මෙම කාර්යාලය 46/1 යෝජනාවේ මෙම පැති ක්‍රියාත්මක කිරීමට 2021 අප්‍රේල් සිට ආරම්භක කණ්ඩායමකින් සූදානම් වීමේ කටයුතු පටන් ගෙන ඇත. මෙම කාර්ය මණ්ඩලය සඳහා බොහෝ දෙනකු බඳවා ගෙන ඇති අතර ඊට අන්තර්ජාතික අපරාධ සහ මානුෂික නීතිය, මානව අයිතිවාසිකම්, ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය ප්‍රචණ්ඩත්වය, වින්දිත අයිතිවාසිකම් සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් ඇතුළත් වේ. කෙසේ වුවත් කණ්ඩායමේ විවිධ සාමාජිකයන්ගේ ආරම්භක දිනය 2022 අයවැය ප්‍රතිපාදනවලින් තවදුරටත් සීමා වේ.

59. මෙම කාර්යාලය 46/1 යෝජනාව යටතේ මැන්ඩේට් බලය පිළිබඳ හඳුන්වා දීමේ තොරතුරු, සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කළ ප්‍රශ්න සහ පිළිතුරු ඇතුළත්, මාර්ගගතව ප්‍රකාශයට පත් කර ඇත.[68]

60. මෙම කාර්යාලය e-discovery මෘදුකාංගය යොදා ගෙන තොරතුරු සහ සාක්ෂි කෝෂ්ඨාගාරයක් ගොඩනගා ඇත. එමෙන්ම දැනටමත් එක්සත් ජාතීන් සතුව ඇති එක් එක් තොරතුරු විශාල සංඛ්‍යාවක් හඳුනා ගෙන ඇත. මෙම කණ්ඩායම වින්දිත කේන්ද්‍රීය පිවිසුමක් අන්තර්ග්‍රහණය කරමින් තවදුරටත් තොරතුරු රැස් කිරීම සඳහා හිඩැස් සහ ප්‍රමුඛතා හඳුනා ගැනීමේ අදහසින් අපරාධ යුක්ති දැක්මකින් තොරතුරු තවදුරටත් විශ්ලේෂණය කරනු ඇත. මෙම කාර්යාලය සතුව ඇති සහ රැස්කර ගත් තොරතුරු රාජ්‍ය සහ රාජ්‍ය නොවන පුද්ගලයන් යන දෙකොටස විසින්ම කරන ලදැයි කියන උල්ලංඝන කිරීම් සහ අපහරණවලට අදාල ය.

61. මහ කොමසාරිස් ගේ කලින් වාර්තාවල යෝජනා ගණනාවක් අතුරින් බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අපහරණ සිදු කෙළේයැයි විශ්වාස කළ හැකි පුද්ගලයන්ට එරෙහිව ඉලක්ක කළ සම්බාධක පැනවීමේ හැකියාව සොයා බැලීමට සාමාජික රටවලට නිර්දේශ කර තිබිණ. බරපතළ උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ ශ්‍රී ලංකාවේ යුද හමුදාවේ නිලධාරීන්

---

[67] A/HRC/RES/46/1 ඡේද 6

[68] https://www.ohchr.org/EN/HRBodies/HRC/Pages/Sri-Lanka-accountability-project.aspx.

දෙදෙනෙකු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 7031(සී) යටතේ විදේශ මෙහෙයුම් සහ 2021 අදාල වැඩ සටහන් විසර්ජන පනත අනුව නම් කරනු ඇතැයි එක්සත් ජනපද ආණ්ඩුව 2021 දෙසැම්බර් 10 ප්‍රකාශයට පත් කෙළේය. ඒ අනුව ඔවුන් එම රටට ඇතුළුවීමට නුසුදුසු වනු ඇත.

62. මහ කොමසාරිස්වරිය මෙම විෂය පිලිබඳව වැඩිදුර ප්‍රගතිය 2022 සැප්තැම්බර් මස වාර්තා කරනු ඇත. 46/1 යෝජනාවෙන් මෙම කාර්යාලයට ලබා දී ඇති වැඩ පරිමාණය ප්‍රමාණවත් බව දැනටමත් පැහැදිලි ය. මෙම මැන්ඩේට් බලය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මානව සහ මුල්‍ය සම්පත් සමග සාමාජික රටවල ඵලදායි සහයෝගිතාවය ද අවශ්‍ය වනු ඇත.

## V නිගමන

63. අතීත මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ වින්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම සඳහා වගවීමක් නොමැතිවීම පිළිබඳව මහ කොමසාරිස්වරිය කණස්සල්ලෙන් පසුවේ. පසුගිය වසර දෙක තුළ අධිකරණයේ ස්වාධීනත්වය, මානව හිමිකම් කොමිසම සහ වෙනත් මූලික ආයතන සෝදා පාළුවට ලක්විය. මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම ඇතුළත් ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය සීමා කෙරිණ. හමුදාකරණය කෙරේ තව දුරටත් යොමුවීමක් සහ සිංහල ජාතිවාදයට වැඩි අවධානයක් යොමුවීම දක්නට ලැබිණ. බුද්ධාගම රාජ්‍ය ආයතන තුළ වඩාත් ප්‍රදර්ශනය වූ අතර සුළුතර ප්‍රජාවන්ගේ කොන්වීම සහ අවිශ්වාසය වැඩි කිරීමෙන් සංහිඳියාව දුර්වල කෙරිණ. එළඹෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම් පත් කිරීමේ ක්‍රියාවලිය මූලික ආයතනවල ස්වාධීනත්වයට අතිශයෙන් වැදගත් වේ. බලය බෙදා හැරීම සහ මානව අයිතිවාසිකම් පිළිබඳ කරුණු සමීපයෙන් අධීක්ෂණය කළ යුතුය. කොවිඩ්- 19 වසංගතය සහ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමට බලපෑ ආර්ථික අර්බුදය මෙම තත්වයට හේතු විය. විවේචනයට සහ විසම්මුතියට ආණ්ඩුව දැඩි පියවරවලින් ප්‍රතිචාරය දැක්වීම නිසා ප්‍රජා අවකාශය දුර්වල කෙරිණ. ආර්ථිකයේ පසු බැසීම පවතින සුළුතර ප්‍රජාව කොන් කිරීම සහ වෙනස් කොට සැලකීම තවදුරටත් වේගවත් වනු ඇත.

64. මහ කොමසාරිස් කාර්යාලය සමග සම්බන්ධවීමට ආණ්ඩුව මෑතකදී දැක්වූ අලුත් විවෘත භාවය සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වෙනස්කම් කිරීම ඇතුළත් සමහර සංශෝධන මුල පිරීමට ගත් මූලික පියවර මහ කොමසාරිස්වරිය පිළිගනී. ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් බැඳීම් සහ බරපතළ උල්ලංඝන කිරීම් නැවත සිදුවීම වැළැක්වීමට අනුකූල වීම සඳහා අවශ්‍ය නෛතික, ආයතනික සහ ආරක්ෂක අංශවල සංශෝධන තව දුරටත් වඩාත් ගැඹුරටත් සිදු කරන මෙන් ඇය ආණ්ඩුවෙන් ඉල්ලා සිටී. මෙම මාර්ගයේ යෑමට ශ්‍රී ලංකාවට සහාය වීමට මානව අයිතිවාසිකම් කාර්යාලය දිගටම සූදානම්ව සිටිනු ඇත. ඇය උසාවියට ඉදිරිපත් වූ සංකේතාත්මක නඩු බොහොමයකට දිගටම බාධා කිරීම් සහ පසුබැසීම් සිදුවීම සහ සත්‍යය සහ යුක්තිය වෙනුවෙන් හෝ තම ආදරණීයයන් සැමරීමට උද්ඝෝෂණය කරන වින්දිතයන්ට සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට හිරිහැර කිරීම ගැන බරපතළ සේ කණස්සල්ලට පත්වන්නීය. ආණ්ඩුව සංහිඳියාවේ පදනමක් වශයෙන්, හානිපූරණය සහ සංවර්ධනය ප්‍රායෝගික පියවර සේ අවධාරණය කරන නමුත් වින්දිතයන් සඳහා සත්‍යය, යුක්තිය සහ සහන සහතික කිරීමට සහ නැවත සිදු නොවීම සහතික කරන ආයතනික සංශෝධන ඇතුළත් විස්තරාත්මක පිවිසුමක් නැතිව එය සාක්ෂාත් කර ගත නොහැකි බව මහ කොමසාරිස්වරිය අවධාරණ කරයි.

65. මෙතෙක් පැවති සියලු ආණ්ඩු ඇතුළත් ශ්‍රී ලාංකික රාජ්‍යය අන්තර්ජාතික අපරාධ සහ බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව නඩු පැවරීමට සහ ඵලදායි සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලියක් අනුගමනය කිරීමට දිගින් දිගටම අපොහොසත්ව ඇත. වත්මන් ආණ්ඩුව මෙම

බරපතළ අන්තර්ජාතික අපරාධ පිළිගැනීමට සහ වගවීම පවත්වා ගැනීමේ අකමැත්ත නොකඩවා ප්‍රදර්ශනය කරනු පමණක් නොව යුධ අපරාධ සිදු කෙළේයැයි සඳහන් සමහර හමුදා නිලධාරීන් ආණ්ඩුවේ ඉහළම තනතුරුවලට පත් කිරීමෙන් මුක්තිය පිළිබඳ කතාව ශක්තිමත් කරයි. වින්දිතයන් සඳහා යුක්තිය ඉටු කරන පියවරවල වාස්තවික ප්‍රතිඵල නොමැතිවීමෙන් මානව අයිතිවාසිකම් මණ්ඩලය වගවීම සඳහා අන්තර්ජාතික උපාය මාර්ග දිගටම පවත්වා ගත යුතුය.

66. මානව අයිතිවාසිකම් මණ්ඩලය සහ එහි විශේෂ ක්‍රියා පටිපාටි, ගිවිසුම් මණ්ඩල, අන්තර්ජාතික සහ ජාතික සිවිල් සමාජ සංවිධාන සහ ආණ්ඩුවේම දේශීය කොමිසම- උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම ( LLRC ) ආණ්ඩුවට මානව අයිතිවාසිකම් තත්වය වැඩි දියුණු කිරීමට සහ අතීත උරුමය ආමන්ත්‍රණය කිරීමට බොහෝ වාස්තවික නිර්දේශ ඉදිරිපත් කර ඇත. සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රගමනයේ දී මෙම නිර්දේශ ආණ්ඩුව, මෙන්ම අන්තර්ජාතික ප්‍රජාව සහ එක්සත් ජාතීන් පදනම් සලකුණු වශයෙන් යොදා ගත යුතුය.[69] මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය මෙහිදී ශ්‍රී ලංකාවට සහාය ලබා දීමටත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණ සහාය ලබා දීමටත් සූදානම් ය. ශ්‍රී ලංකාවට තිරසර සංවර්ධනය සහ සාමය සහ කල් පවත්නා සංහිඳියාව සාක්ෂාත් කර ගත හැකි වන්නේ ප්‍රජා අවකාශය, ස්වාධීන සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා ආයතන තහවුරු කරන්නේ නම් සහ පද්ධතිගත මුක්තිය අවසන් කරන්නේ නම් පමණි.

## VI. නිර්දේශ

67. මහ කොමසාරිස්වරිය මණ්ඩලයට ඇය 2021 ඉදිරිපත් කළ වාර්තාවේ 60 වැනි ඡේදයෙන් ශ්‍රී ලංකාණ්ඩුවට ඉදිරිපත් කළ නිර්දේශ නැවතත් අවධාරණය කරයි.[70] ඇය වැඩි දුරටත් පහත සඳහන් නිර්දේශ ආණ්ඩුවට ඉදිපත් කරයි.:

(අ) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය පුළුල් සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා, අධිකරණය සහ මානව හිමිකම් කොමිසම වැනි මූලික ජාතික ආයතනවල ස්වාධීනත්වය ශක්තිමත් කෙරෙන සහ සංහිඳියාව හා පූර්ණව බද්ධව ඇති සහ දේශපාලන අධිකාරිය විමධ්‍යගත කිරීම ඉදිරියට ගෙන යන සහ ජන සංඛ්‍යාවේ සියලු සාමාජිකයන් මානව අයිතිවාසිකම් පූර්ණව භුක්ති විඳින ආකාරයට සිදුවීම.

(ආ) එක්සත් ජාතීන්ගේ නොයෙකුත් මානව අයිතිවාසිකම් යාන්ත්‍රණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති මානව අයිතිවාසිකම් පිළිබඳව කරන ලද නිර්දේශ සහ ඵලදායි, ස්වාධීන සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා ජාතික ආයතන සඳහා අවශ්‍ය සහතික කිරීම් සැලකිල්ලට ගැනීම.

(ඇ) සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතු පවත්වා ගැනීමට හමුදාව කෙරේ විශ්වාසය රඳවා තැබීම මගහැරීම සහ සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳව හමුදාවේ බලපෑම අඩු කිරීමට පියවර ගැනීම,

(ඈ) නීතිපති දෙපාර්තමේන්තුවට භාවිතයේ දී ස්වාධීනව කටයුතු කිරීමට හැකි බව තහවුරු කිරීම, මානව අයිතිවාසිකම් උල්ලංඝනය සහ හමුදා ශ්‍රේණිය, නිල හෝ වෙනත් බලවත් තනතුරු නොසලකා අන්තර්ජාතික මානුෂීය නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් සිදු කළ බවට සැක කරන ඕනෑම පුද්ගලයකුට එරෙහිව නඩු පැවරීමට කටයුතු කිරීම,

[69] OL LKA(7.2021)

[70] HRC/46/20/ඡේදය 60

(ඉ) බලහත්කාරයෙන් අතුරුදහන් කළ සිද්ධීන්වලට අදාල හමුදා ලේඛනාගාර වහාම විවෘත කිරීම ඇතුළත් අතුරුදහන් සියල්ලන්ගේම ඉරණම සහ සිටින තැන් තීරණය කිරීමට සවිස්තරාත්මක පිවිසුමක් ගැනීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සඳහා අපරාධ වගකීම ඇතැයි සැක කරන සියලු දෙනා ගැන ස්වාධීනව විමර්ශනය කිරීම සහ අතුරුදහන් වූවන්ගේ පවුල්වලට පුළුල් හානිපූරණයක් ලබා දීම,[71]

(ඊ) වින්දිතයන් සඳහා පාරදෘශ්‍ය භාවය පවත්වා ගැනීම සහතික කිරීමට 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය ගැන පත් කළ පරීක්ෂණ කොමිසම් වාර්තාවේ සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම සහ වෙනත් කිසියම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ සම්බන්ධතාවයක් ගැන ස්වාධීන විමර්ශන තවදුරටත් කිරීම,

(උ) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික නීතිමය බැඳීම්වලට පූර්ණව අනුකූල වන බවට තහවුරු කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වඩාත් මූලික සංශෝධන සිදු කිරීම. ඒ අතර තුර අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නියමයන්ට සහ ප්‍රමිතීන්ට පූර්ණයෙන් අනුකූල ව්‍යවස්ථාවක් පනවන තෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම තාවකාලිකව නතර කිරීම[72]

(ඌ) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින සියලු රැඳවියන් පුනරීක්ෂණය කිරීම කඩිනම් කිරීම සහ ප්‍රමාණවත් නීතිමය සහ සාක්ෂි පදනමක් නැතිව රඳවා ගෙන සිටින සියලු දෙනා නිදහස් කිරීම. ත්‍රස්තවාදය වැළැක්වීමේ පියවර ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රජා අවකාශය යටපත් නොකරන බවට සහතික කිරීම

(එ) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, ස්වේච්ඡා සමාජ සේවා ( ලියා පදිංචි කිරීමේ සහ අධීක්ෂණ) පනත, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සහ වෙනත් පුද්ගල නීති ඇතුළත් මූලික නීති කෙටුම්පත් කිරීම සහ සංශෝධනයේ දී සියල්ලන් ඇතුළත් සහ පුළුල් පදනමකින් යුත් උපදේශනයක් සහතික කිරීම.

(ඒ) මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, සමාජ ක්‍රියාකාරීන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වින්දිතයන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සියලු ආකාරයේ සෝදිමත් භාවය සහ හිරිහැර කිරීම සහ පලිගැනීම්වලට ලක් කිරීම වහාම නතර කිරීමට සියලු ආරක්ෂක අංශවලට නියෝග කිරීම.

(ඔ ) ඉඩම් ආරවුල් පාරදෘශ්‍ය, උපදේශනාත්මක, අපක්ෂපාතී සහ වෙනස් කොට නොසලකන ආකාරයෙන් තීරණය කිරීම සහ ආගමික ස්ථාන පිහිටුවීමේ දී අන්තර් ආගමික සංවාදයක් සහතික කිරීම

68. මහ කොමසාරිස්වරිය 2021 ඉදිරිපත් කළ වාර්තාවේ 61 වැනි ඡේදයෙන් මණ්ඩලයට සහ සාමාජික රටවලට කළ නිර්දේශ නැවතත් අවධාරණය කරන අතර ඔවුන්ට වැඩි දුරටත් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.[73]

අ. දේශසීමාවෙන් බාහිර හෝ විශ්ව අධිකරණය පිළිබඳ පිළිගත් මූලධර්ම යටතේ සහ දේශීය අධිකරණයේ අධිකරණ ක්‍රියා පටිපාටි හරහා සියලුම පාර්ශ්වයන් විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද අන්තර්ජාතික අපරාධ පිළිබඳව විමර්ශනය කිරීම සහ නඩු පැවරීමට වින්දිතයන් සහ ඔවුන්ගේ නියෝජිතයන් සමග සහයෝගයෙන් වැඩ කිරීම සහ බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය

[71] බලන්න, A/HRC/33/51/Add.2, ඡේද 17-22
[72] OL LKA (7.2021)
[73] A/HRC/46/20 ඡේදය 61

කිරීම් සහ අපහරණ සිදු කෙළේයැයි විශ්වාස කළ හැකි පුද්ගලයන්ට එරෙහිව ඉලක්ක කර ගෙන පැනවිය හැකි සම්බාධක ගැන දිගටම සොයා බැලීම.

(ආ) පලි ගැනිම්වලට මුහුණ දී සිටින සහ වද හිංසා සහ වෙනත් බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ සැබෑ අනතුරක් පවතින අය සම්බන්ධයන් කිසියම් ආපසු හරවා යැවීමෙන් (Refoulement ) වැළකීමට, ශ්‍රී ලංකා ජාතිකයන් සම්බන්ධයෙන් දේශපාලන රැකවරණ පියවර පුනරීක්ෂණය කිරීම

(ඇ) 46/1 යෝජනාව යටතේ වගවීමට අදාල වැඩ ඉටු කිරීමට සහ එම යෝජනාව යටතේ ලබා දී ඇති සම්පූර්ණ මැන්ඩේට් බලය ඵලදායීව ඉටු කිරීමට හැකි කරනු සඳහා ප්‍රමාණවත් මානව සහ මූල්‍ය සම්පත් ලබා දීමෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට සහයෝගය දැක්වීම

69. එක්සත් ජාතීන්ට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් හිමිකම ලබා දිය යුතුයැයි මහ කොමසාරිස්වරිය නිර්දේශ කරයි:

(අ) සිවිල් සමාජ සංවිධානවලට ඇති තර්ජනය වැළැක්වීමට ඔවුන්ගේ ආරක්ෂාව සඳහා වූ වැඩවල පරිමාණය ඉහළ දැමීම සහ සිවිල් සමාජ සංවිධානවලට ලබා දෙන සහාය වැඩි කිරීම සහ සිවිල් අවකාශය දැඩිව ආරක්ෂා කිරීමට

(ආ) ආරක්ෂක හමුදා සහ ආරක්ෂක අමාත්‍යංශය හෝ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යංශයේ පාලනය යටතේ ඇති සියලු ආයතන සමග කටයුතු කිරීමේ දී මානව අයිතිවාසිකම් පිළිබඳ නිසි අනලස් භාවය සහ එහි මූලධර්ම දැඩිව, සංගතව සහ පුළුල්ව යෙදවීම සහතික කිරීම සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම වැනි ස්වාධීනත්වය යටපත්ව ඇති ව්‍යුහයන් සමග සම්බන්ධවීම සහ උපදෙස් ලබා දීම පුනරීක්ෂණය කිරීම

(ඇ) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය සහතික කිරීමට ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ ගෝලීය සන්ධානයේ ( GANHRI ) අවධානය ආමන්ත්‍රණය කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට යෝජනා ඉදිරිපත් කිරීම

(ඈ) එක්සත් ජාතීන්ගේ සාම සාධනය සම්බන්ධයෙන් බලකා රැස් කර ගැනීමේ පවතින අභියෝග ගැන සම්පූර්ණ අවබෝධයෙන් යුතුව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ වර්තමාන තත්වය යටතේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය සහ ශ්‍රී ලංකාවේ නිලධාරීන් සඳහා වූ නිවාරණ පරික්ෂා කිරීමේ පද්ධති පුනරීක්ෂණය කිරීම.